# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# 2014

## ආපදා කළමනාකරණ අමාත්‍යාංශය

# පෙරවදන

ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ 2014 වර්ෂය සඳහා වන වාර්ෂික කාර්ය සාධන වාර්තාව මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛණ අංක 402 මඟින් ලබා දී ඇති උපදෙස් වලට අනුකූලව සකස් කොට ඇත.

මෙම වාර්තාවේ I කොටස මඟින් අමාත්‍යාංශයේ පොදු තොරතුරු සමඟ සමස්ත මූල්‍ය ප්‍රගතිය ද අමාත්‍යාංශයේ අනෙකුත් අංශයන් විසින් 2014 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා සිදුකරන ලද කාර්යයන් පිළිබඳව ද තොරතුරු ඉදිරිපත් කර ඇති අතර, මෙම වාර්තාවේ II කොටසින් ඉදිරිපත් කරනු ලබන්නේ අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතේ පවතින ආයතනයක් වන ජාතික ආපදා සහනසේවා මධ්‍යස්ථානයේ 2014 වර්ෂය තුළ සිදුකරන ලද කාර්යයන්හි කාර්යසාධනයයි.

# හැඳින්වීම

ආපදා කළමනාකරණ විෂය වඩාත් වැදගත් වීමට හේතුවූ ප්‍රධාන සාධකය වූයේ ශ්‍රී ලාංකීය ජනතාවට මින් පෙර අත්දකින්නට නොලැබුණු ආකාරයේ සිදුවීමක් වූ වර්ෂ 2004 දෙසැම්බර් මස 26 වන දින බලපෑ සුනාමි ව්‍යසනයෙන් තිස්පන්දහසකට (35000) අධික ජීවිත සංඛ්‍යාවක් අහිමි වීමය. එම ව්‍යසනයෙන් ලක්‍ෂ 5කට අධික ජනතාව අභ්‍යන්තර අවතැන් වූවන් බවට පත්විය.

මෙම ජීවිත හානි, ආර්ථික පසුබෑම සහ ඉන් සමාජයට වූ බලපෑම සම්බන්ධයෙන් සුභසාධන කටයුත්තක් සේ පැවති ආපදා කළමනාකරණය සඳහා විධිමත් ක්‍රමවේදයක් හා නීතිමය ව්‍යුහයක අවශ්‍යතාවය ඉස්මතු විය. ඒ අනුව මෙවැනි ව්‍යසනයන්ට සාර්ථකව මුහුණදීමට අවශ්‍ය ආයතනික හා නීතිමය ව්‍යුහය නිර්ණය කිරීම සඳහා පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් ස්ථාපිත කරන ලදි. එම තේරීම් කාරක සභාවේ නිර්දේශයන්ට අනුව 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කර ගන්නා ලදි.

ඒ අනුව 2005 අංක 13 දරණ ව්‍යසන කළමනාකරණ පනතින් ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාවත්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයත් ස්ථාපිත කරන ලදි. එම ආයතන තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා වර්ෂ 2006 ක් වූ පෙබරවාරි මස 20 වෙනි දින නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් ආපදා කළමනාකරණ හා මානව හිමිකම් පිළිබඳ කැබිනට් අමාත්‍යාංශය ස්ථාපිත කරන ලද අතර, 2010 අප්‍රේල් මස 30 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ආපදා කළමනාකරණ අමාත්‍යාංශය ලෙස නම්කොට ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය අමාත්‍යාංශය යටතට ගෙනෙන ලදි.

ආපදා කළමනාකරණයේ දී අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ආපදා සහනසේවා මධ්‍යස්ථානය , කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය යන ආයතන මඟින් අමාත්‍යාංශය වෙත පැවරි ඇති කාර්යයන් සහ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සඳහා ආපදාවක්වීමට පෙර ආපදා අවස්ථාවේ දී සහ ආපදාවලින් පසුව ද මහත් සේවයක් ඉටුකරනු ලැබේ. මේ නිසා ආපදාවලින් ජන ජීවිත දේපල සහ සේවා සුරක්ෂිත වීමත්, ප්‍රත්‍යස්ථ සමාජයක් උදෙසා ප්‍රජා සුරක්ෂිතභාවය තහවුරු කිරීමත්, පශ්චාත් ආපදා අවම කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහාත් පහසුකම් සැපයීම සිදුකරනු ලබයි.

අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය සහ මාර්ගෝපදේශකත්වය යටතේ ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් පහත සඳහන් කාර්යයන් පසුගිය වසර පුරා ක්‍රියාත්මක කරන ලදි.

- ✓ **විපතට පත් ජනතාව සඳහා අවශ්‍ය සහන සැලසීම**

- ✓ **ආපදා වලින් පිඩාවට පත්වන ජනතාව වෙනුවෙන් ව්‍යාපෘති හඳුනා ගැනිම, සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම (ආපදා ප්‍රත්‍යස්ථ නිවාස ඉදි කිරීම ආදිය)**

- ✓ **ස්වාභාවික මෙන්ම මිනිසා විසින් නිර්මිත ආපදාවලින් පීඩාවට පත් ජනතාවගේ ජීවනෝපායන් සහ ආර්ථිකය යථා තත්ත්වයට පත් කරනු පිණිස පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.**

- ✓ **නියඟයෙන් වන පීඩා අවම කිරීම සඳහා ජල සැපයුම් හා නියං සහනාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

- ✓ **ආපදා තත්ත්වයන් පිළිබඳ දත්ත රැස් කිරීම සහ තොරතුරු ප්‍රචාරය කිරීම.**

- ✓ **ආපදා වාතාවරණයන්ට මුහුණ දෙන ආකාරය සහ සහන යාන්ත්‍රණ පිළිබඳව රාජ්‍ය නිලධාරීන් සහ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් මෙහෙයවීම.**

- ✓ **හදිසි ආපදා තත්ත්වයකදී සහන මෙහෙයුම සම්බන්ධීකරණය කිරීම**

- ✓ **කාර්ය-සම්පාදන සේවාවන් සැපයීම**

## දැක්ම

"සුරක්ෂිත ශ්‍රී ලංකාවක්"

## මෙහෙවර

ශ්‍රී ලංකාව තුළ ස්වාභාවික සහ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවන්නා වූ ආපදා වලින් ඇතිවන්නා වූ අහිතකර බලපෑම් ඵලදායි ලෙස වැළැක්වීම සහ අවම කිරීම තුලින් සමෘද්ධිමත් සහ අභිමානවත් ජන ජීවිතයක් සඳහා පහසුකම් සැපයීම.

## අරමුණු

- **ජාතික ආපදා කළමනාකරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම**
- **පූර්ව අනතුරු ඇඟවීමේ සහ ප්‍රචාරණය කිරීමේ යාන්ත්‍රනය ක්‍රියාත්මක කිරීම**
- **සියළු ස්ථර සඳහා ආපදා කළමනාකරණ සැලසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම**
- **සංවර්ධන සැලසුම් සඳහා ආපදා අවදානම අවම කිරීමේ ක්‍රියාදාමයන් අනුගත කිරීම**
- **සංවර්ධන සැලසුම් ක්‍රියාවලිය සඳහා බලපෑම් තක්සේරුකරණය අනුගත කිරීම**
- **ආපදා අවදානම අවම කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් එම ප්‍රදේශ ආපදාවන්ට ලක්වීම අවම කිරීම**
- **නායයෑම් අවදානම් තක්සේරුකරණය සහ සහතික නිකුත් කිරීම**
- **ආපදා වලින් විපතට පත් වූවන් සඳහා සහන සැපයීම**
- **ඇපදා මූලික පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන්**
- **පශ්චාත් ආපදා පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණය**

## කාර්යයන්

මෙම අභිමතාර්ථ ඉටු කර ගැනීම සඳහා 2010 නොවැම්බර් 22 නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් අමාත්‍යාංශය වෙත පහත සඳහන් කාර්යයන් පවරා ඇත.

- ස්වාභාවික විපත් හා මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇති වන විපත්වල දී සහන සැලසීමේ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය හා කළමනාකරණය.
- ව්‍යසන අවම කිරීම, ප්‍රතිචාර දැක්වීම හා යථාත්වීකරණය පිළිබඳ ප්‍රතිපත්ති, වැඩ සටහන් හා ව්‍යාපෘති සම්පාදනය
- අදාල අරමුණු සපුරා ගැනීම සඳහා ජාතික සැලසුම් බලධාරීන් සමග එකගතාවයට පැමිණි කාලසීමාව හා අයවැයගත සම්පත් ප්‍රමානය තුළ ඉහත ප්‍රතිපත්ති වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම
- ජාතික ප්‍රතිපත්තිය මත පදනම් වූ ජාතික ව්‍යසන කළමනාකරණ සැලැස්ම හා හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම සකස් කිරීම
- ව්‍යසන අවම කිරීම, ප්‍රතිචාර දැක්වීම සහ යථාත්වීකරණය පිළිබඳ විදේශීය ආධාර ව්‍යාපෘති ආරම්භ කිරීම හා සම්බන්ධීකරණය
- ඉහත කාර්යයන් නිසි වේලාවට ක්‍රියාත්මක වීම සහතික කර ගැනීම පිණිස අමාත්‍යාංශ හා රාජ්‍ය සංවිධාන සමග සම්බන්ධීකරණය
- ස්වාභාවික ව්‍යසන සහ මිනිසා විසින් සිදු කරනු ලබන ව්‍යසන පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම
- ගංවතුර , නියගය , නායයෑම්, වසංගත රෝග සහ වෙනත් විශේෂ හේතූන් නිසා සිදුවන ආපදාවන්හි දී සහන සැලසීම
- ස්වාභාවික ව්‍යසන සහ මිනිසා විසින් සිදු කරනු ලබන ව්‍යසන වලදී ගලවා ගැනීමේ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම
- පෙර අනතුරු ඇඟවීම් පද්ධතිය ක්‍රියාත්මක කිරීම
- නිවාස හා ගොඩනැගිලි ඉදි කිරීම් තාක්ෂණ ක්ෂේත්‍රයේ පර්යේෂණ හා සංවර්ධන කටයුතු
- කාලගුණ විද්‍යාත්මක සමීක්ෂණ හා පර්යේෂණ කටයුතු
- අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ පවතින ආයතනවල අනෙකුත් සියළුම විෂයයන් හා අධීක්ෂණ කටයුතු

# පටුන

I කොටස


| | | |
|---|---|---|
| 01 | පාලන කටයුතු | 01-08 |
| 02 | සැලසුම් හා සංවර්ධන කටයුතු | 09 - 11 |
| 03 | ගිණුම් කටයුතු | 12 - 13 |
| 04 | ප්‍රසම්පාදන කටයුතු | 14 |
| 05 | අභ්‍යන්තර විගණන කටයුතු | 15 |

II කොටස

| | |
|---|---|
| ජාතික ආපදා සහනසේවා කටයුතු | 16 - 35 |

## 01 . පාලන කටයුතු

✓ කාර්ය මණ්ඩලය

| අංකය | තනතුරු නාමය | අනුමත කාර්යය මණ්ඩලය | තථ්‍ය සේවක මණ්ඩලය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | ලේකම් | 01 | 01 | - |
| 02 | අතිරේක ලේකම් (සංවර්ධන හා සහන සේවා) | 01 | 01 | - |
| 03 | අතිරේක ලේකම් ( මුදල් හා පාලන) | 01 | 01 | - |
| 04 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 01 | 01 | - |
| 05 | ප්‍රධාන ගණකාධිකාරී | 01 | 01 | - |
| 06 | අධ්‍යක්ෂ (ආපදා සහන සේවා) | 01 | 01 | - |
| 07 | අධ්‍යක්ෂ (කළමනාකරණ) | 01 | 01 | - |
| 08 | අධ්‍යක්ෂ (සැලසුම්) | 01 | 01 | - |
| 09 | අධ්‍යක්ෂ (ජාතික ව්‍යසන කළමනාකරණ සභාව) | 01 | 0 | 01 |
| 10 | සහකාර ලේකම් | 02 | 02 | - |
| 11 | ගණකාධිකාරී | 01 | 01 | - |
| 12 | ගණකාධිකාරී (අභ්‍යන්තර විගණන) | 01 | 0 | 01 |
| 13 | නි. අධ්‍යක්ෂ / ස. අධ්‍යක්ෂ (කළමනාකරණ) | 01 | 01 | - |
| 14 | නි. අධ්‍යක්ෂ / ස. අධ්‍යක්ෂ (සැලසුම්) | 01 | 01 | - |
| 15 | නි. අධ්‍යක්ෂ / ස. අධ්‍යක්ෂ (ආපදා සහන සේවා) | 03 | 02 | 01 |
| 16 | නීති නිලධාරි | 01 | 01 | - |
| 17 | පරිපාලන නිලධාරි | 01 | 01 | - |
| 18 | ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම් | 01 | 01 | - |
| 19 | භාෂා පරිවර්තක | 02 | 0 | 02 |
| 20 | සංවර්ධන නිලධාරි | 01 | 01 | - |
| 21 | සංවර්ධන සහකාර | 08 | 08 | - |
| 22 | සංවර්ධන නිලධාරි (111 ශ්‍රේණිය) | 30 | 24 | 06 |
| 23 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 20 | 14 | 06 |
| 24 | දත්ත සටහන් ක්‍රියාකරු | 01 | 0 | 01 |
| 25 | කාර්මික නිලධාරි | 01 | 01 | - |
| 26 | නිශ්චල ඡායාරූප ශිල්පි | 01 | 0 | 01 |
| 27 | කැමරා ක්‍රියාකරු (තාවකාලික) | 01 | 0 | 01 |
| 28 | කැමරා ක්‍රියාකරු (සහායක) | 01 | 01 | 0 |
| 29 | රියදුරු | 15 | 11 | 04 |
| 30 | කාර්යාල කාර්ය සහායක | 15 | 11 | 04 |
| **එකතුව** | | **117** | **88** | **28** |

✓ **ස්ථාන මාරුවීම් / විශ්‍රාම ගැන්වීම්**

2014 වර්ෂයේ ජනවාරි මස සිට එම වර්ෂයේ දෙසැම්බර් මස දක්වා අමාත්‍යාංශයේ සේවක මහත්ම මහත්මීන් දසදෙනෙකු වෙනත් සේවා ස්ථාන සඳහා මාරුවීම් ලැබ ඇති අතර, අමාත්‍යාංශය වෙත ස්ථානමාරු ලැබ පැමිණි සේවක මහත්ම මහත්මීන් ගණන නවදෙනෙකි .

✓ **පාර්ලිමේන්තු උපදේශක කාරක සභා රැස්වීම් පැවැත්වීම**

2014 වර්ෂයේ ආපදා කළමනාකරණ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවේ රැස්වීම් වාර 06ක් පවත්වා ඇත. ඉන් අමාත්‍යාංශය වෙත ලැබී ඇති යෝජනා 15ක් සඳහා පිළිතුරු ලබා දී ඇත.

✓ **ආපදා කළමනාකරණ පනත සංශෝධනය කිරීම**

මෙම පනත 2005 වර්ෂයේ සිට බලාත්මක වී ඇති අතර, ප්‍රායෝගිකව පනත ක්‍රියාත්මක වීමේ දී ඇති වූ ගැටළු අවම කර ගැනීම සඳහා කරන ලද සංශෝධන ඇතුලත් සංශෝධිත පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් කෙටුම්පත් කරන ලද අතර, නීතිපතිතුමා ගේ අනුමැතිය ලබා ගැනීම සඳහා මේ වන විට කෙටුම්පත යොමු කර ඇත. පනත සංශෝධනය වීමෙන් පසු මිනිසා විසින් ඇති කරනු ලබන සහ ස්වභාවිකව ඇතිවන්නා වූ ආපදා වඩා ඵලදායී අයුරින් කළමනාකරණය කිරීමේ හැකියාව ලැබෙනු ඇත.

✓ **ජාතික ආපදා කළමනාකරණ ප්‍රතිපත්තිය**

වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව ආපදා කළමනාකරණය සිදු කිරීම සඳහා අවකාශ සැලසෙන අයුරින් අමාත්‍යාංශය විසින් ආපදා කළමනාකරණ ප්‍රතිපත්තිය සකස්කර අවසන්කර ඇති අතර, ඒ සඳහා අමාත්‍යමණ්ඩල අනුමැතිය ලැබී ඇත. මේ වන විට එහි මුද්‍රණ කටයුතු සිදුකෙරෙමින් පවතී.

✓ **ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධාන පනත**

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයට නීතිමය වශයෙන් පිළිගැනීමක් ඇතිකිරීම සඳහා 2011 වසරේ ආරම්භ කරන ලද ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සඳහා වන පනත් කෙටුම්පත මේ වන විට නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් සකස් කර අවසන් කර ඇත. මෙම පනත් කෙටුම්පත නීතිපතිවරයාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා මේ වන විට යොමු කර ඇත. දැනටමත් ලාභ ලබන ආයතනයක් වන ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය වෙත නිතිමය භාවයක් ලබාදීම තුලින් නායයෑම් අවදානම අවම කිරීමට අදාල පර්යේෂණ , ක්ෂේත්‍ර සමීක්ෂණ සහ අනිකුත් අදාල කටයුතු සාර්ථකව සහ කායීක්ෂමව මෙන්ම ඵලදායි අන්දමින් සම්පූර්ණ කිරීමටත්, එම ආයතනයෙන් ලබාදියහැකි තාක්ෂණික සේවය උපරිම මට්ටමින් සලසාදීමටත් හැකිවනු ඇත. එසේම ආයතනයේ මුදල් ඉපයීමේ ක්‍රය ශක්තිය වර්ධනයට ද එය ඉවහල් වනු ඇත.

✓ **ශ්‍රී ලංකා අකුණු ආරක්ෂණ පනත**

ශ්‍රී ලංකාවේ මෑතක දී අකුණු අනතුරු බහුල වීම නිසා 2013 මැයි මස 17 දින හා අංක: අමප/12/0598/548/002 දරණ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව අකුණු ආරක්ෂණය පිළිබඳ ජාතික මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම හා අකුණු ආරක්ෂණය පිළිබඳ අවශ්‍ය නීති පැනවීම සඳහා පනතක් සකස් කිරීමේ කටයුතු සඳහා කමිටුවක් පත්කරන ලදි. එම කමිටුව මඟින් පනත කෙටුම්පත් කොට අවසන් කර ඇති අතර, පළමු කැබිනට් තීරණයේ යම් යම් ගැටළු සහගත අවස්ථා නිරාකරණය කර ගැනීම සඳහා නැවත කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට නියමිතය. දැනටමත් එම කැබිනට් තීරණයට අනුව අකුණු අනතුරු පිළිබඳ අන්තර්කාලීන කමිටුව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව යටතේ ස්ථාපිත කර ඇති අතර, මේ තුලින් ශ්‍රී ලංකාවේ අකුණු අනතුරු මඟින් සිදුවන ජීවිත හා දේපල හානි අවම කරගැනීමේ හැකියාව වර්ධනය සඳහා උපදෙස් හා දැනුවත් කිරීම් ක්‍රියාත්මක කරනු ලැබේ. එය සුරක්ෂිත ප්‍රජාවක් සහිත රටක් ඇතිකිරීමට උපකාරි වේ.

✓ **නීතීමය කටයුතු**

2014 වසර තුළ අමාත්‍යාංශයට එරෙහිව පැවරුණු නීති කෘත්‍යයන් ගණන එකක් (01) වන අතර, පෙර වසරේ පැවති නඩු කටයුතු ද ඇතුළුව මෙම වසරේ නඩු වාර නවයක් (09) සඳහා පෙනී සිටීම සිදු කරන ලදි. මෙම නීති කෘත්‍යයන් තවදුරටත් විභාග වෙමින් පවති.

**අන්තර් කාලීන කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම**

✓ **ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය**

2007.03.13 දිනැති අංක 07/0435/343/002 දරණ කැබිනට් පත්‍රිකාව මඟින් අනුමැතිය ලැබ මෙම කමිටුව පිහිටුවන ලදි. ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානයේ පරිපාලනමය, මූල්‍යමය හා කලමනාකාරීත්ව බලතල ක්‍රියාත්මක කිරීම සඳහා ද අනෙකුත් වැදගත් තීරණ ගැනීම පිණිස පිහිටුවන ලද අන්තර් කාලීන කලමනාකරණ කමිටුව මසකට වරක් ආපදා කලමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ සභාපතීත්වයෙන් රැස්වේ. සාමාජිකයින් අටදෙනෙකුගෙන් සමන්විත මෙම කමිටුව 2014 වර්ෂය තුළ රැස්වීම් වාර දොළහක් (12) ක් පවත්වා ඇති අතර, එහිදී ගන්නා ලද තීරණ අනුව ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානයෙන් සපයනු ලබන කාර්යයන් වඩාත් කාර්යක්ෂමව කිරීමට හැකියාව ලැබිණි.

✓ **ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ යහපාලනය, කළමනාකරණය සහ මූල්‍ය පාලනය විධිමත් කිරීමේ අරමුණින් මෙම අන්තර්කාලීන කළමනාකරණ කමිටුව පිහිටුවා ඇත. රාජ්‍ය ව්‍යවසායන්හි යහ පාලනය සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන යටතේ ස්ථාපිත කර ඇති මෙම කමිටුව ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම් ගේ සහභාගී.ීවයෙන් යුත් සාමාජිකයින් සත් දෙනෙකුගෙන් සමන්විත වන අතර, එමඟින් ඉහත විධිවිධානයන්ට අනුකූලව තීරණ ගැනීම, මෙහෙයවීම සහ අධීක්ෂණය කිරීම සිදුකරනු ලබයි. 2014 වර්ෂය තුළ රැස්වීම් වාර දහයක් (10) පවත්වා ඇත.

- ✓ **ජාත්‍යන්තර හා කලාපීය සහයෝගීතාවය**

ජාත්‍යන්තර හා කලාපීය සහයෝගීතාවය වර්ධනය වන අයුරින් ආපදා කළමනාකරනණය , ජනතාවට සහන සැලසීම, ආපදා කළමනාකරණ නීතිය, දේශගුණික විපර්යාස ආදී වශයෙන් ශ්‍රී ලංකාවට බලපානු ලබන විවිධ බලපෑම් සම්බන්ධයෙන් කලාපීය රටවල දැණුම සහ සහයෝගය ලබාගනුවස් අමාත්‍යාංශය නියෝජනය කරමින් අමාත්‍යාංශයට අයත් ආයතන හතරෙහි නියෝජිතයින් ලේකම් තුමිය ගරු අමාත්‍යතුමා විසින් විශේෂ කාර්යභාරයක් ඉටුකර ඇත.

- ✓ **මහජන පැමිණිලි**

2014 වර්ෂයේ අමාත්‍යාංශය වෙත ආපදා සම්බන්ධ පැමිණිලි 25 ක් ලැබුණු අතර එම පැමිණිලි අමාත්‍යාංශය යටතේ ඇති ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය, ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයට හා අදාළ රේඛීය අමාත්‍යාංශ වෙත අවශ්‍ය කටයුතු සඳහා යොමු කර ඇත. 2012 වසරේ ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව 81 ක් වන අතර, එය 2013 වන විට 35 ක් ද වශයෙන් පැහැදිලි අඩුවීමක් දක්නට ලැබේ. මේ තුළින් පැහැදිලි වන්නේ අමාත්‍යාංශයේ මැදිහත් වීම මත මුළු දිවයින පුරා සිදුකරනු ලබන දැනුවත් කිරීම් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල පවත්වාගෙන යනු ලබන දිස්ත්‍රික් ආපදා සහ සහනසේවා නිලධාරීන් ගේ සේවය යහපත් අයුරින් ක්‍රියාත්මක වී ඇති බවයි.

- ✓ **ඵලදායිතා / කළමනාකරණ වැඩසටහන**

ක්‍රමවිධි හා ක්‍රියාපිළිවෙත් සංවර්ධනය කිරීමට පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා විශ්ව විද්‍යාල කථිකාචාර්යවරයෙකු සම්බන්ධ කර ගැනීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත ඉල්ලීම් යොමු කරන ලදි. අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන හතරෙහිම පුරවැසි සේවාලාභි ප්‍රඥප්තිය ත්‍රෛභාෂාවෙන් සකස් කර අන්තර්ජාලය වෙත මේ වන විට මුද්‍රාහැරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත.
සම්පත් භාවිතයේ අරපිරිමැස්ම අරමුණු කර ගනිමින් පාවිච්චියට ගත නොහැකි කඩදාසි ප්‍රතිචක්ක්රීකරණ ක්‍රියාවලිය සඳහා යොමු කරනු ලැබේ.

**පුහුණු වැඩසටහන්**

- ➢ **දේශීය**

අමාත්‍යාංශයේ නිලධාරින්ගේ හැකියා වර්ධනය කිරීමේ අරමුණින් දීර්ඝකාලීන පුහුණු වැඩසටහන් සඳහා එක් නිලධාරියෙකු ද දෙමළ පුහුණු පාඨමාලාව සඳහා නිලධාරින් 30 දෙනෙකු ද කෙටිකාලීන පුහුණු වැඩසටහන් සඳහා නිලධාරින් 8 දෙනෙකුද සහභාගී කරවන ලදි.

- ➢ **විදේශීය**

අමාත්‍යාංශය නියෝජනය කරමින් විදේශීය සමුළු, රැස්වීම්, සම්මන්ත්‍රණ පුහුණු වැඩමුළු 13ක් සඳහා නිලධාරින් 9 දෙනෙකු සහභාගී වී ඇත.

➢ **අමාත්‍ය මණ්ඩල සංදේශ හා තීරණ**

| **අනු අංකය** | **විෂයය** | **අමාත්‍ය මණ්ඩල අනුමැතියට යොමුකළ දිනය** | **අමාත්‍ය මණ්ඩල තීරණයෙහි අංකය සහ අනුමත දිනය** |
|---|---|---|---|
| 01 | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ 2011 වාර්ෂික වාර්තාව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම මැයෙන් වූ අමාත්‍ය මණ්ඩල තීරණයට අදාළ වාර්තාව | 2014.01.22 | අමප/14/0093/548/001<br>2014.01.30 |
| 02 | ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගේ උපදේශක තනතුරට පත්කර ඇති බී.එච්.එම්.රත්නසිරි මහතාගේ කොන්ත්‍රාත් කාලය වසරකින් දීර්ඝ කිරීම | 2014.01.23 | අමප/14/0177/548/002<br>2014.02.13 |
| 03 | ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා පත්කිරීම එල්.බී.ආර්.මාර්ක් මහතා | 2014.05.21 | අමප/14/0639/548/003<br>2014.06.19 |
| 04 | ශ්‍රී ලංකා ආපදා කළමනාකරණය පිළිබඳ පුළුල් වැඩසටහන 2014-2018 | 2014.06.20 | අමප/13/1829/548/012-1<br>2014.07.17 |
| 05 | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ කටයුතු පරීක්ෂා කිරීමේ විද්වත් කමිටුව සඳහා ගෙවීම් කිරීම | 2014.07.09 | අමප/14/0920/548/004<br>2014.08.07 |
| 06 | ජාතික සුරක්ෂිත දිනය සැමරීම 2014 | 2014.09.15 | අමප/14/1318/548/005<br>2014.09.30 |
| 07 | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ 2012 වාර්ෂික වාර්තාව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම | 2014.10.03 | අමප/14/1674/548/007<br>2014.12.04 |
| 08 | ස්වාභාවික ආපදා සඳහා කඩිනම් ප්‍රතිචාර දැක්වීම සඳහා වන සාක් ගිවිසුම අපරානුමත කිරීම සඳහා ගරු අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම | 2014.10.16 | අමප/13/1758/548/003-11<br>2014.10.30 |
| 09 | 2014.10.29 වන දින කොස්ලන්ද මීරියබැද්ද ප්‍රදේශයේ නායයෑම හේතුවෙන් මියගිය අය වෙනුවෙන් අවමංගලාධාර ලබා දීම හා තුවාල ලැබූවන් හට වෛද්‍යාධාර ලබා දීම | 2014.11.27 | අමප/14/1726/548/008<br>2014.12.17 |
| 10 | නායයාම් උවදුරට ලක්වන ප්‍රජාවගේ අවදානම අවම කිරීම | 2014.11.25 | අමප/14/1727/548/009<br>2014.12.17 |
| 11 | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ විද්‍යාඥයින් සඳහා වෘත්තීය දීමනාවක් අනුමත කර ගැනීම | 2014.12.16 | අමප/14/1843/548/010<br>2014.12.23 |

➢ **භාණ්ඩ සමීක්ෂණ කාර්යයන්හි ප්‍රගතිය**

2014 වර්ෂයට අදාලව අමාත්‍යාංශය තුළ තිබෙන සියළු භාණ්ඩ සමීක්ෂණයට ලක්කර එහි වාර්තාව විගණකාධිපතිවෙත යොමු කිරීමට කටයුතු කර ඇති අතර, පත් කරන ලද විශේෂ කමිටුවක් මඟින් හඳුනාගෙන ඇති විනාශකලයුතු ලිපිලේඛණ හා ලිපිගොනු විනාශ කිරීමේ කටයුතු මේ වන විට ක්‍රමයෙන් සිදුකරමින් පවතී.

- **ආපදා කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය - 2014**

    - ✓ "අනාගතයේ අපට අවැසි සුරක්ෂිත ශ්‍රී ලංකාවක්" යන්න තේමාව කරගනිමින් 2014 සැප්තැම්බර් මස 24, 25 සහ 26 යන තෙදින තුළ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයක් බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පවත්වන ලදි. මෙම ජාත්‍යන්තර සම්මන්ත්‍රණය පැවැත්වීමේ මූලික අරමුණ වූයේ 2004 වර්ෂයේ ඇතිවූ සුනාමි ව්‍යසනයෙන් පසු ආපදා කළමනාකරණ අමාත්‍යාංශය සහ ඊට අනුබද්ධ ආයතන හා වෙනත් රජයේ ආයතන , දේශීය හා විදේශීය ස්වේච්ඡා සංවිධාන විසින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් හා ව්‍යාපෘති පිළිබඳ උගත් පාඩම් පිළිබඳ දැනුවත් කිරීම් ඇතුලත් පසුවිපරමක් සිදු කිරීමයි. මෙහිදී දෙස් විදෙස් සම්පත් දායකයන්ගේ සහභාගීත්වය ඇතිව තේමාවන් විසි හතක් (27) ඔස්සේ දේශණ පවත්වන ලදි. තවද මේ සඳහා ආපදා කළමනාකරණ ක්ෂේත්‍රයට අදාලව කටයුතු කරන දෙස් විදෙස් ක්‍රියාකාරි ආයතන හාරසිය පණහක (450) පමණ ක්‍රියාකාරීන් සහභාගී විය. මෙහි මූල්‍ය දායකත්වය සඳහා ශ්‍රී ලංකා රතු කුරුස සංවිධානය , විදේශීය මූල්‍ය ආධාර සපයන ආයතන මෙන්ම දේශීය ස්වේච්ඡා සංවිධානයන්ගේ සහයෝගය ද ලැබිණි.



Disaster Management
CONFERENCE 2014
The future we want - A safer Sri Lanka
24-26 September 2014 | BMICH, Colombo - Sri Lanka

- **ජාතික සුරක්ෂිත දිනය**

"ජාතික සුරක්ෂිත දිනය" වාර්ෂිකව පැවැත්වීමේ අරමුණ වූයේ ස්වාභාවික හා මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවන ආපදා පිළිබඳව මහ ජනතාවගේ දැනුවත් භාවය වර්ධනය කිරිම හා ඒ සඳහා ඔවුන්ගේ අවධානය යොමු කරවීම, ආපදා අවම කිරීම, වැලැක්වීම හා පූර්ව සූදානම යන ක්ෂේත්‍ර කෙරෙහි ජනතාවගේ ආකල්පමය වෙනසක් ඇති කිරීම හා විශේෂයෙන්ම 2004 දෙසැම්බර් මස 26 වෙනි දින ඇති වූ සුනාමි වැනි ව්‍යසනයන්ට ඉදිරියේ දී නිසි ප්‍රතිචාර දැක්වීමේ හැකියාව වර්ධනය කිරීමත්ය. එම කරුණු පෙරදැරිව 2014 දෙසැම්බර් 26 වෙනි දින මෙම උත්සවය හම්බන්තොට මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී කථානායක ගරු චමල් රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදි. මෙවර පැවති සැමරුම් දිනයේ දී පහත සඳහන් කාර්යයන් ක්‍රියාවට නංවන ලදි.

- ❖ දිවයින පුරා ආපදා සම්බන්ධ දැනුවත් කිරිමේ වැඩසටහන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය යන ආයතන 4ම එක්ව සිදුකිරීම. එහිදී දිස්ත්‍රික් මට්ටමේ,

ප්‍රාදේශීය මට්ටමේ, පළාත් පාලන නියෝජිතයින් හා නිලධාරීන් දැනුවත් කිරීම, ආපදා කළමනාකරණය සම්බන්ධ පාසැල්, ස්වේච්ඡා කණ්ඩායම්, ස්වේච්ඡා තරුණ කණ්ඩායම් පිහිටුවීම, ගිනි ආරක්ෂණ, ප්‍රථමාධාර හා කඳවුරු කළමනාකරණය සම්බන්ධව, ජීවිත ආරක්ෂාව, සෙවීම් හා මුදවා ගැනීම, ආවදානම් ජලාශ අසල දැනුවත් කිරීමේ පුවරු සවිකිරීම, සුනාමි පෙරහුරු, නායයෑම් පෙරහුරු වැනි වැඩසටහන් කිරීම.

- ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හා අධ්‍යාපන අමාත්‍යාංශය එක්ව ජාතික මට්ටමේ රචනා හා චිත්‍ර තරඟ වයස් කාණ්ඩ අනුව සිදුකර ජයග්‍රාහකයින් සඳහා ත්‍යාග හා සහතිකපත් ලබා දීම.

- ආපදා අවස්ථාවලදී ආයතනය තුළ කටයුතු කරන ලද හොඳම නිලධාරියා තෝරා කුසලාන හා සහතිකපත්‍ර ලබා දීම.

- හොඳම ආපදා සේවකයා තෝරා කුසලාන, මුදල් ත්‍යාග හා සහතිකපත්‍ර ලබා දීම.

- මීරියබැද්ද නායයාමෙන් දෙමාපියන් දෙදෙනාම අහිමිවූ දරුවන් තිදෙනා ඇතුලු සියලුම දරුවන් සඳහා බැංකු ගිණුම් පොත් ලබා දීම. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ මූලිකත්වයෙන් දිවයිනේ සෑම දිස්ත්‍රික්කයකම ආපදා ප්‍රත්‍යස්ථ නිවාස ඉදිකිරීම සංකේතවත් කරමින් උත්සවය දින නිවාස 3ක යතුරු නිවාසලාභීන් වෙත ලබා දීම.


- **"දැයට කිරුළ " සංවර්ධන වැඩසටහන හා ප්‍රදර්ශනය**


දැයට කිරුළ ප්‍රදර්ශනය , ප්‍රදර්ශන මට්ටමින් පමණක් නොව ඒ තුළින් රටේ සංවර්ධන කාර්යයට උර දීමක් වශයෙන් විවිධ පළාත් මට්ටමින් ක්‍රියාත්මක කිරීමේ ක්‍රම වේදය ආරම්භකල 2010 වර්ෂයේ සිට මේ දක්වා එවැනි සංවර්ධන වැඩසටහන් වසර පහක දී (05) මහනුවර, බුත්තල, අනුරාධපුර, අම්පාර, කුලියාපිටිය වශයෙන් විවිධ ප්‍රදේශවල පවත්වා ඇති අතර, එම අවස්ථාවන්හී දී ප්‍රාදේශීය මට්ටමින් ආපදා අවම කිරීමේ සුළු පරිමාණයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, විසිරි ජල පද්ධති බෙදාදීම, වැසිජල ටැංකි බෙදාදීම, කාලගුණ විද්‍යාව හා ස්වාභාවික ව්‍යසන සම්බන්ධ දැනුවත් කිරීම්,වර්ෂාමාපක ස්ථාපිත කිරීම්, නායයෑම් අවම කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ආදී වශයෙන් විවිධ කාර්යයන් ඔස්සේ මහජනතාව වෙත සහන සැලසීම සිදු කර ඇත.

2014 වර්ෂයේ දී මෙම ජාතික සංවර්ධන වැඩසටහන කුරුණෑගල, කෑගල්ල, පුත්තලම යන දිස්ත්‍රික්ක තුනම ආවරණය වන පරිදි ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කල අතර, ඒ සඳහා අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන හතරෙහි සහයෝගය ලබාගන්නා ලදි. මේ යටතේ ආපදා ප්‍රත්‍යස්ථ නිවාස තුනක් (03) ඉදිකිරීම හා අදාල සියළු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආවරණය වන පරිදි වර්ෂාමාපක 15 ක් ස්ථාපිත කිරීම, ආපදා අවම කිරීමේ ව්‍යාපෘති 14 ක් ක්‍රියාත්මක කිරීම, ආපදා අවස්ථාවන්හි දී ප්‍රයෝජනයට ගතහැකි උපකරණ ආදිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් බෙදාදීම සිදු කරන ලදි. එසේම ආපදා කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීම සඳහා අමාත්‍යාංශය යටතේ ඇති ආයතන ඒකාබද්ධ වැඩසටහනක් ද ක්‍රියාත්මක කරන ලදි.

**මූල්‍ය ප්‍රගතිය**

2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙත පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රතිපාදන වෙන් වූ ආකාරය හා වියදම් කල ආකාරය පහත පරිදි පැහැදිලි කල හැකිය.



## 02 . සැළසුම් හා සංවර්ධන කටයුතු

- **සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණය**

අමාත්‍යාංශය හා ඊට අනුබද්ධිත කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය සහ ජාතික ආපදා සහනසේවා මධ්‍යස්ථානය විසින් දේශීය හා විදේශීය අරමුදල් භාවිතා කරමින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන් / ව්‍යාපෘති සම්බන්ධීකරණය හා අධීක්ෂණ කටයුතු සංවර්ධන හා සැලසුම් අංශය මඟින් සිදුකරනු ලබයි.

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතියට නිර්දේශ සහිතව ව්‍යාපෘති ඉදිරිපත් කිරීම, මූල්‍ය ආයතන (Donor Agencies) සමඟ අවශ්‍ය සම්බන්ධීකරණය සිදු කිරීම, මහ භාණ්ඩාගාරයෙන් අවශ්‍ය ප්‍රතිපාදන සහ අක්මුදල් නිසි වේලාවට නිදහස් කර ගැනීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය කටයුතු සිදුකිරීම මෙන්ම සංවර්ධන වැඩසටහන්/ව්‍යාපෘතිවලට අදාල ප්‍රගති සමාලෝචන කටයුතු සිදුකර ප්‍රගතිය විමර්ශණය කිරීම තුළින් අපේක්ෂිත අරමුණු /ඉලක්ක ළඟාකර ගැනීම සහ පැනනැගි ඇති ගැටළු නිරාකරණය කරගැනීම සඳහා අවශ්‍ය උපදෙස් සහ මගපෙන්වීම ලබාදෙන ලද අතර, එය අදාල ප්‍රදේශවල ආපදා අවම කිරීම සඳහා ඉවහල් විය.

2014 වර්ෂය තුළ ව්‍යාපෘති අධීක්ෂණ හා ක්‍රියාකාරි කණ්ඩායමේ රැස්වීම් වාර දොළහක් (12) ක් පවත්වා ඇති අතර, එහිදී අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම සම්බන්ධයෙන් සාකච්ඡා කර 2014 වසර තුළ අවසන් කලහැකි වූ ව්‍යාපෘතිත්හි ප්‍රගතිය පිළිබඳව සෑහිමකට පත්වීමට හැකි වූ අතර, තවදුරටත් ක්‍රියාත්මක වීමට නියමිත ව්‍යාපෘති කඩිනමින් අවසන් කිරීමට අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම ලබාදීමට කටයුතු කර ඇත.

මීට අමතරව 2014 වර්ෂයේ දී පහත සඳහන් ව්‍යපෘති ක්‍රමවත් පරිදි අධීක්ෂණය කිරීම මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලද ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ සමාජ හා ආර්ථික තත්ත්වය යහපත් කර ගැනීමට සහායක් වීමට හැකිවී ඇත.

- නායයෑම් සිදුවියහැකි ප්‍රදේශවල විශේෂ භූ සමීක්ෂණ සිදු කිරීම
  (මහනුවර , කුරුණෑගල, හම්බන්තොට)
- දියතලාව බස් නැවතුම්පොළ ආශ්‍රිතව ඇති භූමි ප්‍රදේශයේ අස්ථාවරත්වය ස්ථායීකරණය කිරීම සඳහා වන ව්‍යාපෘතිය
- පැෂන්වත්ත ප්‍රදේශයේ භූමි අස්ථාවරත්වය ස්ථායීකරණය කිරීම සඳහා වන ව්‍යාපෘතිය
- පුංචි රත්තොට ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය
- ඒකාබද්ධ නායයාම් අවම කිරීමේ ව්‍යාපෘතිය අදියර 1
- පානදුර, යාපනය සහ දඹුල්ල ගංවතුර අවම කිරීමේ ව්‍යාපෘති

- **ව්‍යාපෘති අධීක්ෂණය**

ව්‍යාපෘති අධීක්ෂණය යටතේ, 2014 දැයට කිරුළ සංවර්ධන වැඩසටහනට සමගාමීව ඉදිකරන ලද ආපදා ප්‍රත්‍යස්ත නිවාස ඉදිකිරීම් කටයුතුවල ප්‍රගතිය පරික්ෂාකර බැලීම සඳහා පුත්තලම දිස්ත්‍රික්කයේ මුන්දලම සහ කුරුණෑගල දිස්ත්‍රික්කයේ බිංගිරිය යන ස්ථානයන්හි ක්ෂේත්‍ර චාරිකාවක යෙදුනි. ඒ අනුව නිවාස ඉදිකිරීමේ කටයුතු සාර්ථකව සිදුකර තිබූ අතර, සුළු සුළු ඉදිකිරීම් පමණක් තවදුරටත් පැවතිනි. මීට අමතරව පානදුර ගංවතුර ආපදා අවමකිරීමේ ව්‍යාපෘතියේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා ද සහභාගී වූ අතර, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී ඇතිවී තිබූ යම් යම් ගැටළුකාරි තත්ත්වයන් සඳහා විසඳුම් ලබාදීමේ හැකියාව ඇතිවිය. ව්‍යාපෘති අධීක්ෂණ කටයුතු සිදුකිරීම තුළින් අදාල ව්‍යාපෘතින්හි අවසන් අරමුණ කරා සාර්ථකව ළඟාවීමට හැකියාව ලැබී තිබේ. තවද මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක අදාල ප්‍රදේශවල ඇතිවන

ගංවතුර තර්ජන සඳහා සාර්ථකව මුහුණදීමේ හැකියාව ලැබී ඇති අතර, විශේෂයෙන් පානදුර ප්‍රදේශයේ වාර්ෂික ගංවතුර තත්ත්වය අවමකර ගැනීමට හැකිවීම මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සාර්ථක ප්‍රතිඵලයක් වශයෙන් සැලකිය හැකිය.

- **2015 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති අනුමැතිය සඳහා යොමු කිරීම**

රට තුළ ඇතිවන්නා වූ ආපදාවන් අවම කිරීම සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරමින් දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ අනුමැතිය ඇතිව ලබාගන්නා ලද ව්‍යාපෘති පෙරසූදානම් සැලසුම් යටතේ ව්‍යාපෘති 08 ක් ද පූර්ව දැනුම්දීම් හා හදිසි මෙහෙයුම් යටතේ ව්‍යාපෘති 04 ක් ද පුහුණු හා අධ්‍යාපනය සඳහා ව්‍යාපෘති 5 ක් ද ආපදා අවම කිරීමේ ව්‍යාපෘති 9 ක් ද පර්යේෂණ හා සංවර්ධන යටතේ ව්‍යාපෘති 5 ක් ද වශයෙන් රු.මිලියන 2900.65 කට ඇස්තමේන්තුගත ව්‍යාපෘති 31 ක් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගැනීම සඳහායොමු කරන ලදි.

- **ශ්‍රී ලංකා ආපදා කළමනාකරණය පිළිබඳ පුළුල් වැඩසටහන (2014-2018)**

2013 වර්ෂයේ දී ආරම්භ කරන ලද මෙම ආපදා කළමනාකරණය පිළිබඳ පුළුල් වැඩසටහන ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව එහි ප්‍රධාන නිමවුම් 43 කට අදාලව වගකිවයුතු පාර්ශවකාර ආයතන 45 ක් යටතේ හඳුනාගත් ක්‍රියාකාරකම් 2014 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදි. ඒ සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල මඟින් 2014 වර්ෂයේ දී වෙන්කරන ලද මුදල රුපියල් මිලියන 38.00 කි. එහි මූල්‍ය ප්‍රගතිය 100% වූ අතර භෞතික ප්‍රගතිය ලඟාකරගත් ආකාරය පහත සඳහන් පරිදි වේ.

01. ශ්‍රී ලංකා ආපදා කළමනාකරණය පිළිබඳ පුළුල් වැඩසටහනට අදාල වැඩසටහන් කළමනාකරණ ඒකකය අවශ්‍ය මූලික සම්පත් වලින් යුක්තව පිහිටුවීම. වියදම රු.මි.2.27 කි.

02. ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය විසින් හඳුනාගෙන ඇති නායයාම් අවධානම් සහිත කලාප සඳහා පූර්ව දැනුම්දීමේ පද්ධතිය ශක්තිමත් කිරීමට අවශ්‍ය ස්වයංක්‍රීය වර්ෂාමාණ 20 ක් ස්ථාපිත කිරීම ආරම්භ කරන ලදි. මෙම ව්‍යාපෘතියෙහි භෞතික ප්‍රගතිය 60% ක් වන අතර, 2015 මාර්තු මස අවසන් වන විට ව්‍යාපෘතියෙහි කටයුතු අවසන් කිරීමට සැලසුම් කර ඇත. ඇස්තමේන්තුගත වටිනාකම රු.මි. 20 කි.

03. ගංවතුර අවදානම වැඩිවශයෙන් බලපානු ලබන නගර 17 ක් හඳුනාගෙන ඇති අතර, එම නගර ආශ්‍රිත ප්‍රදේශ සඳහා අවදානම් පැතිකඩ (Risk Profiles) සකස් කිරීමට අවශ්‍ය 1: 5000 මූලික සිතියම්කරණ කටයුතු මිනින්දෝරු දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන ලදි. මෙම ව්‍යාපෘතිය සඳහා මුළු පිරිවැය රුපියල් මිලියන 9.6 ක් වන අතර, ඉන් රුපියල් මිලියන 6.6 ක් මේවන විට එම දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇත.

04. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් පිළියෙල කර ඇති ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම ( NEOP) ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම සඳහා වන අවශ්‍ය සැලසුම් කරන ලද ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලද අතර, ඒ සඳහා රුපියල් මිලියන 1.0 ක් ලබා දී ඇත. මේ සම්බන්ධයෙන් වන තෙදින වැඩමුළුවක් බදුල්ල දිස්ත්‍රික් ලේකම්ගේ ප්‍රධානත්වයෙන් බදුල්ල දිස්ත්‍රික්කයේ දී පවත්වන ලදි.

05. ජාතික ආපදා සහනසේවා මධ්‍යස්ථානයේ පශ්චාත් ආපදා සහන සේවා කටයුතු විධිමත් කිරීම සඳහා ස්ථාපිත කර ඇති ‘‘සහන තොරතුරු ජාලය‘‘ ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ලැප්ටොප් පරිගණක 23 ක් මිලදී ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලද අතර, ඒ සඳහා රුපියල් මිලියන 1.72 ක් වැය කරන ලදි.

06. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ හැකියා වර්ධනය කිරීම සඳහා ඉන්දීය කාලගුණ විද්‍යාඥයින්ගේ සම්පත් දායකත්වය මත සැලසුම් කරන ලද පුහුණු වැඩසටහනට අදාල අනුමැතිය ලබාගන්නා ලදි.

07. ආපදා කළමනාකරණය පිළිබඳ පුළුල් වැඩසටහනේ ප්‍රධාන පාර්ශවකාර ආයතනයක් වන වාරිමාර්ග දෙපාර්තමේන්තුවට පැවරී ඇති ක්‍රියාකාරකම් වලට අනුව එම දෙපාර්තමේන්තුව විසින් දැනට පවතින ගංවතුර ආරක්ෂණ ආඥා පනත සංශෝධනය කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදි.



**දැනුවත් කිරීමේ වැඩමුළුවක ඡායාරූපයකි.**





**ස්වයංක්‍රීය වර්ෂාමාණ ස්ථාපිත කිරීම**

## 03. ගිණුම් කටයුතු

- **වියදම් ඇස්තමේන්තුව - 2014**

රුපියල්

| | අමාත්‍ය කාර්යාලය 106 – 01 - 01 | | පරිපාලන හා ආයතනික සේවා 106 – 01 – 02 | |
|---|---|---|---|---|
| | පුනරාවර්තන | ප්‍රාග්ධන | පුනරාවර්තන | ප්‍රාග්ධන |
| ඇස්තමේන්තු ප්‍රතිපාදන | 54,050,000.00 | 6,680,000.00 | 66,835,000.00 | 61,468,000.00 |
| මු.රෙ 66 යටතේ මාරුකිරීම් සහ පරිපූරක ප්‍රතිපාදන | 367,000.00 | 374,000.00 | | |
| ශුද්ධ ප්‍රතිපාදන | 54,417,000.00 | 4,054,000.00 | 68,003,000.00 | 61,920,000.00 |
| වියදම | 52,865,092.00 | 3,911,067.00 | 63,000,636.00 | 60,734,865.00 |
| වියදම් ප්‍රතිශතය | 97% | 96% | 93% | 98% |

- **වියදම් සඳහා මූල්‍යකරණය**

| සංකේතය | වියදම් මූල්‍යකරණය | ශුද්ධ ප්‍රතිපාදන | සත්‍ය වියදම | වියදම් ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 11 | දේශීය අරමුදල් | 149,926,000.00 | 142,511,660.00 | 95% |
| 12 | විදේශීය ආධාර ණය | | | |
| 13 | විදේශීය ආධාර ප්‍රධාන | 38,468,000.00 | 38,000,000.00 | 99% |


- **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**

රුපියල්

| | වියදමෙහි උපරිම සීමාව | ලැබීමේ අවම සීමාව | උපරිම හර ශේෂ සීමාව |
|---|---|---|---|
| විසර්ජන පනතින් බලය දෙනු ලැබූ සීමාව | 7,000,000.00 | 2,500,000.00 | 16,000.000.00 |
| 2014.12.31 දිනට සත්‍ය අගය | 6,815,248.00 | 3,714,426.00 | 12,912,245.50 |

➢ **2014.12.31 දිනට ණය / අත්තිකාරම්**

| ණය වර්ගය | ණය ප්‍රමාණය (රුපියල්) | ණය ලබාගත් සංඛ්‍යාව |
|---|---|---|
| උත්සව අත්තිකාරම් | 1,078,000.00 | 213 |
| විශේෂ අත්තිකාරම් | 92,500.00 | 37 |
| ආපදා ණය | 5,638,748.00 | 51 |
| පාපැදි ණය | 6,000.00 | 01 |




➢ 2014 විසර්ජන ගිණුම සහ රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ‘‘බී‘‘ ගිණුම 2014.12.31 දිනට සකස් කර මේ වන විට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර ඇත.

## 04 . ප්‍රසම්පාදන කටයුතු

- ✓ 2014 වර්ෂය තුළ අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ විස්තර (රු.මි.)

<u>අමාත්‍ය කාර්යාලය</u>

**1201 - ලිපිද්‍රව්‍ය**

| | |
|---|---|
| ප්‍රතිපාදන | - 2.09 |
| වියදම | - 2.09 |
| මූල්‍යමය ප්‍රගතිය | - 100% |

**2102 - ගෘහභාණ්ඩ හා කාර්යාලයීය උපකරණ**

| | |
|---|---|
| ප්‍රතිපාදන | - 1.12 |
| වියදම | - 1.09 |
| මූල්‍යමය ප්‍රගතිය | - 98% |

**2103 - යන්ත්‍රෝපකරණ**

| | |
|---|---|
| ප්‍රතිපාදන | - 1.25 |
| වියදම | - 1.23 |
| මූල්‍යමය ප්‍රගතිය | - 99% |

<u>අමාත්‍යාංශ කාර්යාලය</u>

**1201 - ලිපිද්‍රව්‍ය**

| | |
|---|---|
| ප්‍රතිපාදන | - 1.40 |
| වියදම | - 1.40 |
| මූල්‍යමය ප්‍රගතිය | - 100% |

**2102 - ගෘහභාණ්ඩ හා කාර්යාලයීය උපකරණ**

| | |
|---|---|
| ප්‍රතිපාදන | - 0.5 |
| වියදම | - 0.5 |
| මූල්‍යමය ප්‍රගතිය | - 100% |

**2103 - යන්ත්‍රෝපකරණ**

| | |
|---|---|
| ප්‍රතිපාදන | - 0.6 |
| වියදම | - 0.6 |
| මූල්‍යමය ප්‍රගතිය | - 100% |

## 05 . අභ්‍යන්තර විගණන කටයුතු

2014 වර්ෂයට අදාලව ආපදා කළමනාකරණ අමාත්‍යාංශය සහ ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය සම්බන්ධයෙන් විගණන පරික්ෂණ තුනක් (03) සිදුකර ඇති අතර, විශේෂ විමර්ශන හයක් (06) සිදුකර ඇත. අදාල විමර්ශන සිදුකරන ලද ක්ෂේත්‍රයන් පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ.

01. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට අයත් මත්තල කාලගුණ විද්‍යා කාර්යාලය සම්බන්ධ විමර්ශනය
02. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට අයත් හම්බන්තොට දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකය සම්බන්ධ විශේෂ විමර්ශනය
03. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන ලද ඩොප්ලර් වෙදර් රේඩාර් පද්ධතිය සම්බන්ධ ව්‍යාපෘතිය
04. කොළඹ දිස්ත්‍රික් අභ්‍යන්තර විගනන වැඩසටහන
05. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පෙර සූදානම් සැලසුම් වැඩසටහන් සම්බන්ධයෙන් වන විමර්ශණය
06. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් 2014 වර්ෂය සඳහා ක්‍රියාත්මක කරනු ලබන ආපදා කළමනාකරණ ව්‍යාපෘති සම්බන්ධ විමර්ශනය.

මීට අමතරව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් හතරක් (04) ක් පවත්වා ඇත. ලැබී ඇති විගණන විමසුම් ගණන පනස් හයක් (56) වන අතර, එකී විගණන විමසුම් පනස්හය (56) සඳහාම පිළිතුරු සපයා ඇත.

# 11 කොටස

# ජාතික ආපදා සහනසේවා මධ්‍යස්ථානය

## හැඳින්වීම

ජාතික ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය 1996 වර්ෂයේදී සමාජ සේවා සහ සමාජ සුභසාධන අමාත්‍යාංශය යටතේ පිහිටුවන ලදී. සහන, පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණ කටයුතු සැලසුම් කරනු පිණිස හා ක්‍රියාත්මක කරනු පිණිස එය 2005.12.08 දින අංක 1422/22 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ආපදා සහන සේවා අමාත්‍යාංශය යටතට පත් විය. 2007.01.09 දින අංක 1482/9 දරන ගැසට් නිවේදනය මගින් එය ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය යනුවෙන් නම් කොට නැවත පදිංචි කිරීමේ හා ආපදා සහන සේවා අමාත්‍යාංශය වෙත පවරන ලදී. අංක 1651/220 දරන ගැසට් නිවේදනය ප්‍රකාරව 2010.04.30 දින සිට ක්‍රියාත්මක වන පරිදි ආපදා කළමනාකරණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විය.

ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය කොළඹ 07, විද්‍යා මාවතේ පිහිටුවා ඇති ආපදා කළමනාකරණ ආමාත්‍යාංශයේ අමාත්‍යවරයා සහ ලේකම් විසින් දෙනු ලබන ප්‍රතිපත්ති මාර්ගෝපදේශකත්වය යටතේ ක්‍රියාත්මක වෙයි. ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් දෙනු ලබන ප්‍රතිපත්ති මාර්ගෝපදේශකත්වය අනුව අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා එහි ව්‍යාපෘති සහ වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. එමෙන්ම අදාළ දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ අධීක්ෂණය යටතේ සංවර්ධන සහකාර (ආපදා කළමනාකරණ), සංවර්ධන නිලධාරී (ආපදා සහනසේවා) ආපදා සහන සම්බන්ධීකාරකවරු ලෙස ක්‍රියා කරති.

### දැක්ම

**ප්‍රශස්ථ පසු ආපදා සහන සේවාවන් තුළින් වඩාත් සුරක්ෂිත ශ්‍රී ලංකාවක් කරා යාම.**

### මෙහෙවර

**ස්වභාවික හා මිනිසා විසින් ඇති කරනු ලබන ආපදාවන්ගෙන් සිදුවන අනර්ථකාරී බලපෑම්වලට ප්‍රතිචාර දැක්වීම හා යථාවත් කිරීම මගින් මිනිස් ජීවිත, දේපළ හා ජන ජීවිතය සුරැකීම.**

### අරමුණ

**සමාජයට පරිසරයට හා ආර්ථිකයට ආපදා වලින් ඇති කරන අහිතකර බලපෑම් අවම කිරීම සහ ආපදා සහන සඳහා ජාතික ධාරිතාවන් ශක්තිමත් කිරීම තුළින් තිරසාර සංවර්ධනය කිරීමේ ජාතික අරමුණට දායක වීම.**

**ඉලක්ක සහ ක්‍රියාකාරකම්**

- පසු ආපදා කළමනාකරණ ක්‍රියාකාරකම් සිදු කිරීම.
- තොරතුරු සන්නිවේදන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම.
- ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- යහ පාලනය ඇති කිරීම

**පසු ආපදා කළමනාකරණ ක්‍රියාකාරකම් සිදු කිරීම**

- කාර්යක්‍ෂම ආපදා සහන සේවාවක් තුලින් සුදුසු ප්‍රතිලාභියා වෙත ආපදා සහන ලබාදීම.
- ආපදා හේතුවෙන් හානියට ලක්වූ නිවාස ප්‍රතිසංස්කරණය කිරීම
- වගාහානි , ස්වයං රැකියා හානි හා ග්‍රාමීය සුළු පරිමාණ යටිතල පහසුකම් සිදු කිරීම
- පසු ආපදා කළමානාකරණ ක්‍රියාවලීන් පිළිබඳව ආපදා සහන සේවා නිලධාරීන් බලමුළු ගැන්වීම

**තොරතුරු සන්නිවේදන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම**

- අන්තර්ජාල තොරතුරු පද්ධතිය මගින් ආපදා සිදු වී කෙටි කාලයක් තුළ තොරතුරු ලබා ගැනීම
- තොරතුරු සන්නිවේදන ජාලය ශක්තිමත් කිරීම

**ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.**

- ආපදා හේතුවෙන් සිදුවන හානිය අවම කරගැනීම සඳහා ග්‍රාමීය මට්ටමින් ඇතිකරනු ලබන ආපදා සහන සේවා කමිටු බලමුළු ගැන්වීම.
- පසු ආපදා තත්තවයන්ට මුහුණදීම සඳහා ප්‍රජාව දැනුවත් කිරීම
- පසු ආපදා තත්තවයන්ට මුහුණදීම සඳහා පාසල් මට්ටමින් ශිෂ්‍ය ප්‍රජාව දැනුවත් කිරීම

**යහ පාලනය ඇති කිරීම**

- සහනසේවා ලබාදීම පිළිබඳ මෙහෙයවීම, අධීක්ෂණය හා ඇගයීම් සිදු කිරීම
- ලබා දී ඇති චක්‍රලේක  හා මාර්ගෝපදේශ අනුව ක්‍රියාකිරීම

**කාර්ය මණ්ඩලය**

| අනු අංකය | තනතුර | සේවය | අනුමත කාර්යය මණ්ඩලය | තථ්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|---|---|
| 01 | අධ්‍යක්ෂ | ශ්‍රී. ල. පරි. සේ | 01 | 01 | - |
| **02** | නියෝජ්‍ය අධ්‍යක්ෂ | ශ්‍රී. ල. පරි. සේ | 01 | - | 01 |
| **03** | සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී. ල. පරි. සේ | 02 | 01 | 01 |
| **04** | සංවර්ධන සහකාර (ආපදා කළමනාකරණ) | - | 32 | 31 | 1 |
| **05** | සංවර්ධන නිලධාරී (ආපදා කළමනාකරණ) | සංවර්ධන නිලධාරි සේවය | 04 | 04 | - |
| **06** | සංවර්ධන නිලධාරී (ආපදා සහන සේවා) | සංවර්ධන නිලධාරි සේවය | 332 | 313 | 19 |
| **07** | රාජ්‍ය කළමනාකරණ සහකාර | රා. ක. ස. සේ | 08 | 04 | 04 |
| **08** | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිළධාරී ( II පංතිය) | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය | 02 | - | 02 |
| **09** | ව්‍යාපෘති නිලධාරි | - | 01 | - | 01 |
| **10** | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර ( III පංතිය) (දත්ත සටහන් ක්‍රියාකරු) | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය | 01 | - | 01 |
| **11** | රියදුරු | රියදුරු සේවය | 07 | 04 | 03 |
| **12** | කාර්යාල කාර්යය සහායක | කා. සේ. සේ | 04 | 04 | - |
| **13** | ලොරි රියදුරු සහායක | - | 05 | 03 | 02 |
| **එකතුව** | | | **400** | 365 | **35** |

**ස්ථානමාරුවීම්**

2014 වර්ෂය ඇතුලත අභ්‍යන්තර ස්ථානමාරුවීම් හතක් (07) සිදුවූ අතර, වෙනත් දෙපාර්තමේන්තු වලින් ස්ථානමාරු ලැබ පැමිණි ගණන හතර (04) කි.

**දේශීය පුහුණු**

ව්‍යාපෘති කළමනාකරණය හා අපදා ප්‍රත්‍යස්ත භාවය ශක්තිමත් කිරීම සඳහා නායකත්වය ලබාදීම සම්බන්ධයෙන් වූ දේශීය පුහුණු සඳහා 2014 වසරේ දී නිලධාරීන් හත් දෙනෙකු (07) යොමු කිරීම සිදු කර ඇත.

විදේශීය පුහුණු

Sida's international training programmer on public service management Disaster resilience leadership , ARF Cross-sectoral Security Cooperation on Bio –Preparedness and Disaster Response Workshop යන වැඩමුළු සඳහා නිලධාරීන් දෙදෙනෙකු සහභාගී වී ඇත.

**මූල්‍ය ප්‍රගතිය**

2014 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන වලට අනුව ජාතික ආපදා සහනසේවා මධ්‍යස්ථානය සඳහා පුනරාවර්තන වියදම් වශයෙන් රුපියල් මිලියන 667.39 ක් ද ප්‍රාග්ධන වියදම් සඳහා රු. මිලියන 2084.42 ක් ද ප්‍රතිපාදන ලෙස වෙන්කරන ලදි. ඒ අනුව 2014 වර්ෂය සඳහා පුනරාවර්තන වියදම රු.මිලියන 662.24 ක් වූ අතර එය ප්‍රතිශතයක් වශයෙන් ගත් කල 99% කි. වසරේ ප්‍රාග්ධන වියදම රු.මිලියන 1983.86 ක් වූ අතර එය ප්‍රතිශතයක් වශයෙන් ගත් කල 95% කි. ඒ අනුව සමස්ත වියදම 2646.10 ක් වූ අතර එය ප්‍රතිශතයක් ලෙස ගත්කල 96% කි.


**ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය (NDRSC) විසින් ලබා දෙන ලද සේවාවන්**

ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය (NDRSC) ආපදා සහන කටයුතු සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කිරීම සිදුකරනු ලබන අතර, ආපදා සහනසේවා කටයුතු සිදුකිරීම සඳහා මඟපෙන්වීමක් වශයෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය මඟින් ජාතික අයවැය චක්‍රලේඛ අංක 152 (I),(II),(III) නිකුත් කරන ලදි. ඒ අනුව ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් යටතේ, පසු ආපදා කළමනාකරණ ක්‍රියාකාරකම් සිදු කිරීම හා කාර්යක්ෂම ආපදා සහන සේවාවක් තුලින් සුදුසු ප්‍රතිලාභියා වෙත ආපදා සහන ලබාදීම මූලිකවම සිදු කරනු ලැබේ.

2014 ජනවාරි මස සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා ඇතිවූ ආපදාවන් හේතුවෙන් පීඩාවට පත් ජනතාවගේ දෛනික ජනජීවිතයට සිදුවූ බලපෑම අවම කිරීම හා ඔවුන්ගේ ජීවිතය යථා තත්ත්වයට පත් කිරීම සඳහා කඩිනම් ආපදා සහනාධාර කටයුතු වෙනුවෙන් දිස්ත්‍රික්ක වෙත රුපියල් මිලියන 508.43 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් නිදහස්කොට ඇත. විපතට පත් පවුල් සඳහා පිසූ ආහාර, වියළි සලාක , මුළුතැන්ගෙයි උපකරණ , වෘත්තීයමය මෙවලම් , අවමංගල්‍ය සහනාධාර ලබාදීමට අමතරව ආපදාවකින් තුවාල ලබන පුද්ගලයින්ගේ වියදම් ගෙවීම් මේ යටතේ ආවරණය කෙරේ.

| දිස්ත්‍රික්කය | ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි | වියදම රු.මිලියන |
|---|---|---|
| අම්පාර | 51.34 | 59.14 |
| අනුරාධපුර | 52.00 | - |
| බදුල්ල | 20.95 | - |
| මඩකලපුව | 92.50 | 77.80 |
| කොළඹ | 2.60 | 2.77 |
| ගාල්ල | 2.78 | 2.71 |
| ගම්පහ | 4.22 | 4. 50 |
| හම්බන්තොට | 21.76 | 19. 75 |
| යාපනය | 12.69 | 12.67 |
| කළුතර | 18.55 | 18.53 |
| මහනුවර | 5.69 | 5.68 |
| කෑගල්ල | 0.99 | 0.7 |
| වවුනියාව | 9.30 | 4.23 |

| දිස්ත්‍රික්කය | ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි | වියදම රු.මිලියන |
|---|---|---|
| කිලිනොච්චි | 27.06 | 26.96 |
| කුරුණෑගල | 12.94 | 3.11 |
| මන්නාරම | 20.61 | 17.70 |
| මාතලේ | 4.16 | 4.06 |
| මාතර | 3.62 | 3.49 |
| මොණරාගල | 8.70 | 7.69 |
| මුලතිවු | 5.93 | 5.93 |
| නුවරඑළිය | 3.25 | - |
| පොලොන්නරුව | 37.46 | 30.17 |
| පුත්තලම | 17.10 | 17.07 |
| රත්නපුර | 6.51 | 6.47 |
| ත්‍රිකුණාමලය | 65.68 | - |
| **එකතුව** | **508.43** | **331.24** |




2014 වර්ෂයේ සිදු වූ ආපදා වලින් විශාල වශයෙන් පවුල් සඳහාහානි සිදුවී ඇත්තේ නියඟයෙනි. පවුල් 989,046 කට තම දෛනික පැවැත්ම උදෙසා පානීය ජලය හා ආහාර සපයාගැනීමේ දුෂ්කරතා ඇතිවිය. ඊට අමතරව ගංවතුර, සුළිසුළං, නායයාම් හා අකුණු හේතුවෙන් විශාල පිරිසක් ආපදාවට ලක්විය. එම ජනතාව මුහුණදී ඇති අපහසුතාවයන්ගෙන් මුදවාගැනීමේ කටයුතු සහනසේවා නිලධාරීන් විසින් සිදුකල අතර ඔවුනට අවශ්‍ය අනෙකුත් සේවාවන් සැපයීම හා ඔවුන්ගේ ජනජීවිතය යථාතත්ත්වයට පත්කිරීමේ කටයුතු සහන සේවා නිලධාරීන් විසින් තවදුරටත් සිදුකරමින් පවති. පූර්ණ නිවාස හා අර්ධ නිවාස හානි සිදු වූ පවුල් වෙත ප්‍රතිපදාන ලබාදීම හා පසුවිපරම් කිරීම මේ වන විටත් සිදුකරමින් පවති.

දිස්ත්‍රික් අනුව ආපදාවට ලක්වූ පවුල් සංඛ්‍යාව - 2014

| දිස්ත්‍රික්කය | නියඟය | ගිණි | ගංවතුර | සුළිසංළං | නායයාම් | අකුණු | වෙනත් |
|---|---|---|---|---|---|---|---|
| අම්පාර | 43054 | | 96028 | 921 | | 4 | 15 |
| අනුරාධපුර | 174830 | | 13030 | 311 | | 3 | 1081 |
| බදුල්ල | 6498 | 10 | 204 | 3627 | 915 | 7 | 3134 |
| මඩකලපුව | 97465 | | 139501 | 54 | | | |
| කොළඹ | 65 | 27 | 2548 | 486 | 33 | 12 | 85 |
| ගාල්ල | 21306 | 5 | 4582 | 100 | 132 | 22 | 28 |
| ගම්පහ | | 190 | 10033 | 418 | 2 | 7 | 105 |
| හම්බන්තොට | 65300 | 59 | 497 | 525 | | 1 | 1 |
| යාපනය | 65901 | | 2017 | | | | 4847 |
| කළුතර | 4775 | | 20379 | 764 | | | 1638 |
| මහනුවර | 3057 | 2 | 137 | 185 | 213 | 2 | 3032 |
| කෑගල්ල | 4577 | 35 | 244 | 224 | 144 | 34 | 339 |
| කිලිනොච්චි | 23915 | | 6631 | | | 10 | 2 |
| කුරුණෑගල | 119766 | 5 | 2627 | 607 | | 8 | 55 |
| මන්නාරම | 36158 | | 9404 | 167 | | | |
| මාතලේ | 1570 | | 2221 | 157 | 105 | 5 | 492 |
| මාතර | | 2 | 5969 | 133 | 9 | 136 | 1524 |
| මොණරාගල | 43503 | 2 | 59 | 168 | | 3 | |
| මුලතිවු | 30970 | | 3645 | 599 | | | 1 |
| නුවරඑළිය | | 69 | 112 | 543 | 185 | 8 | 1387 |
| පොලොන්නරුව | 71967 | | 39347 | 23 | | 1 | |
| පුත්තලම | 75286 | 15 | 12467 | 109 | | 2 | 16 |
| රත්නපුර | 29328 | 6 | 5238 | 1192 | 943 | 10 | 461 |
| ත්‍රිකුණාමලය | 52017 | | 41857 | 63 | | 2 | 11 |
| වවුනියාව | 17738 | 3 | 12030 | 2468 | | 3 | 3 |
| **එකතුව** | **989046** | **430** | **430807** | **13844** | **2681** | **280** | **18257** |

**මූලාශ්‍රය : ජා.ආ.ස.සේ.ම.**

## ආපදා හේතුවෙන් විපතට පත් ජනතාව වෙත ලබාදුන් සහන සඳහා වියදම - 2014

| | දිස්ත්‍රිකය | අම්පාර | මඩකළපුව | කොළඹ | ගාල්ල | ගම්පහ | හම්බන්තොට | යාපනය |
|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රතිපාදන ලබාදුන් පුද්ගල සංඛ්‍යාව | පිසූ ආහාර | 17644 | 79206 | 3856 | 10919 | 22332 | 0 | 4174 |
| | වියළි සළාක | 222240 | 170360 | 2642 | 5350 | 1003 | 0 | 23994 |
| | මරණ | 2 | 8 | 3 | 4 | 4 | 0 | 1 |
| | තුවාල | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| | මුළුතැන්ගෙයි උපකරණ (පවුල් සංඛ්‍යාව) | 60 | 0 | 0 | 0 | 0 | 3137 | 4 |
| | පානීය ජලය | 107803 | 0 | 65 | 18386 | 0 | 178688 | 32524 |
| | වෙනත් | 635 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| වියදම රු. | පිසූ ආහාර. | 3,369,569.00 | 31,473,375.75 | 2,507,992.00 | 1,147,917.50 | 3,978,106.99 | 0 | 1,391,550.00 |
| | වියළි සළාක | 50,869,731.11 | 42,996,241.01 | 134,200.00 | 936,215.00 | 114,956.00 | 0 | 3,818,922.96 |
| | මරණාධාර | 30,000.00 | 120,000.00 | 45,000.00 | 60,000.00 | 60,000.00 | 0 | 15,000.00 |
| | වෛද්‍යාධාර | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| | මුළුතැන්ගෙයි උපකරණ | 90,000.00 | 0 | 0 | 0 | 0 | 4,705,500.00 | 6,000.00 |
| | පානීය ජලය | 3,109,477.74 | 993,851.72 | 27,597.00 | 568,495.24 | 0 | 15,051,500.00 | 7,423,986.30 |
| | වෙනත් | 1,564,027.00 | 1,869,156.59 | 1,670.00 | 0 | 0 | 0 | 18,626.00 |
| | පරිපාලන | 110,314.00 | 353,907.23 | 55,750.00 | 0 | 337,970.00 | 0 | 0 |
| | මුළු වියදම | 59,143,118.85 | 77,806,532.30 | 2,772,209.00 | 2,712,627.74 | 4,491,032.99 | 19,757,000.00 | 12,674,085.26 |

| | දිස්ත්‍රිකය | කළුතර | නුවර | කෑගල්ල | කිළිනොච්චි | කුරුණෑගල | මාතලේ | මාතර |
|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රතිපාදන ලබාදුන් පුද්ගල සංඛ්‍යාව | පිසූ ආහාර | 41705 | 5799 | 1093 | 7112 | 6148 | 1345 | 967 |
| | වියළි සළාක | 16294 | 9124 | 804 | 18063 | 7897 | 12034 | 21135 |
| | මරණ | 20 | 4 | 2 | 4 | 9 | 3 | 7 |
| | තුවාල | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| | මුළුතැන්ගෙයි උපකරණ (පවුල් සංඛ්‍යාව) | 132 | 7 | 0 | 0 | 845 | 0 | 9 |
| | පානීය ජලය | 4474 | 12799 | 0 | 31556 | 6672 | 1143 | 0 |
| | වෙනත් | 0 | 0 | 0 | 0 | 1039 | 0 | 0 |
| වියදම රු. | පිසූ ආහාර. | 5,667,545.15 | 2,259,185.17 | 336,638.00 | 1,229,349.70 | 3,770,380.00 | 407,772.00 | 140,425.00 |
| | වියළි සළාක | 9,600,696.00 | 2,362,919.44 | 354,352.60 | 4,018,615.37 | 3,926,005.00 | 1,070,888.00 | 3,058,158.00 |
| | මරණාධාර | 300,000.00 | 60,000.00 | 30,000.00 | 60,000.00 | 135,000.00 | 45,000.00 | 105,000.00 |
| | වෛද්‍යාධාර | 0 | 0 | 0 | 0 | 0 | 0 | 2,500.00 |
| | මුළුතැන්ගෙයි උපකරණ | 198,000.00 | 10,500.00 | 0 | 0 | 1,267,500.00 | 0 | 13,500.00 |
| | පානීය ජලය | 672,248.00 | 470,673.59 | 0 | 20,563,716.43 | 866,149.40 | 624,580.00 | 0 |
| | වෙනත් | 0 | 217,086.20 | 0 | 804,385.50 | 2,096,000.00 | 1,839,852.00 | 173,266.00 |
| | පරිපාලන | 2,097,630.38 | 301,137.78 | 19,589.00 | 289,533.00 | 1,053,984.35 | 75,943.00 | 0 |
| | මුළු වියදම | 18,536,119.53 | 5,681,502.18 | 740,579.60 | 26,965,600.00 | 13,115,018.75 | 4,064,035.00 | 3,492,849.00 |

| | දිස්ත්‍රිකය | මොණරාගල | මුලතිව් | පොළොන්නරුව | පුත්තලම | රත්නපුර | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රතිපාදන ලබාදුන් පුද්ගල සංඛ්‍යාව | පිසූ ආහාර | 0 | 1061 | 24777 | 31401 | 20673 | 280212 |
| | වියළි සළාක | 3090 | 3155 | 24371 | 39971 | 6954 | 588481 |
| | මරණ | 1 | 1 | 0 | 1 | 13 | 87 |
| | තුවාල | 0 | 0 | 0 | 0 | 3 | 3 |
| | මුළුතැන්ගෙයි උපකරණ (පවුල් සංඛ්‍යාව) | 3 | 0 | 0 | 367 | 0 | 4564 |
| | පානීය ජලය | 52696 | 26956 | 104466 | 24953 | 52488 | 655669 |
| | වෙනත් | 0 | 0 | 0 | 0 | 0 | 1674 |
| වියදම රු. | පිසූ ආහාර. | 0 | 237,145.00 | 11,482,424.09 | 4,898,370.06 | 2,624,869.00 | 76,922,614.41 |
| | වියළි සළාක | 873,792.96 | 752,465.00 | 2,695,033.65 | 9,299,506.46 | 1,165,517.00 | 138,048,215.56 |
| | මරණාධාර | 15,000.00 | 15,000.00 | 0 | 15,000.00 | 195,000.00 | 1,305,000.00 |
| | වෛද්‍යාධාර | 0 | 0 | 0 | 0 | 30,000.00 | 32,500.00 |
| | මුළුතැන්ගෙයි උපකරණ | 4,500.00 | 0 | 0 | 550,500.00 | 0 | 6,846,000.00 |
| | පානීය ජලය | 6,803,957.02 | 4,921,398.68 | 14,939,044.45 | 634,626.51 | 1,097,543.00 | 78,768,845.08 |
| | වෙනත් | 0 | 0 | 57,980.00 | 1,159,776.94 | 88,978.00 | 9,890,804.23 |
| | පරිපාලන | 0 | 7,597.58 | 1,000,312.10 | 516,274.40 | 1,276,712.00 | 7,496,654.82 |
| | මුළු වියදම | 7,697,249.98 | 5,933,606.26 | 30,174,794.29 | 17,074,054.37 | 6,478,619.00 | 319,310,634.10 |

මූලාශ්‍රය : ජා.ආ.ක.සේ.ම.

විශේෂයෙන් ගංවතුර අවස්ථාවන්හිදී අවතැන්වන ජනතාව තාවකාලිකව රැඳවුම් මධ්‍යස්ථාන වෙත ස්ථානගත කිරීමේදී එම මධ්‍යස්ථානයන්හි ඉදිකිරීම වෙනුවෙන් කූඩාරම් ලබාදීම හා එවැනි ආපදා අවස්ථාවන්හිදී සහනසේවා කඳවුරු වෙත පැමිණෙන ජනාතාවගේ ආහාර අවශ්‍යතාවය සපුරාලීම වෙනුවෙන් ලබාදෙන ප්‍රතිපාදනවලට අමරතව ආහාර පිසීමේ උපකරණ කට්ටල ලබාදීම ද සිදුකොට ඇත.

ආහාර පිසීමේ උපකරණ කට්ටලයට අයත් වන අයිතමයන් පහත පරිදි වන්නේය.

| ද්‍රව්‍ය | ප්‍රමාණය |
|---|---|
| සාස්පාන් 12×26 | 1 |
| සාන්පාන් 15×30 | 1 |
| ගෑස් සිලින්ඩර් | 1 |
| රෙගියුලේටර් | 1 |
| ලී පත්ත | 1 |
| හිරමණ | 1 |
| කේතල (ලීටර් 10) | 1 |

මීට අමතරව ආපදාවට ලක්වන ජනතාවගේ ජීවිත යථා තත්ත්වයට පත්කර ගැනීම  සඳහා අවශ්‍ය වන සහන ද්‍රව්‍ය  ඔවුන් වෙත ලබාදීම පහත පරිදි සිදුකර ඇත.

සඳහා ලබාදුන් සහනාධාර අයිතමයන් 2014

| ද්‍රව්‍යය | අම්පාර | අනුරාධපුර | බදුල්ල | ගම්පහ | කළුතර | පොළොන්නරුව | රත්නපුර | ත්‍රිකුණාමලය | කොළඹ |
|---|---|---|---|---|---|---|---|---|---|
| ජල බෝතල්(ලීටර් 5) | | 2444 | 23 | | | | | | |
| ජල බෝතල්(ලීටර් 1.5) | | | 192 | | | | | | |
| ජල බෝතල්(ලීටර් 19) | | 150 | | | | | | | |
| ජල ටැංකි(ලීටර් 1000) | | | | | | 8 | | 100 | |
| බ්ලැන්කට් | | 2000 | 999 | | | | 300 | | |
| ඇඳ ඇතිරිලි | 99 | | 119 | 100 | 300 | 919 | 200 | | |
| ඇඳ ඇතිරිලි(ඉන්දියන්) | | | 440 | | | | | | |
| ටාපෝලීන් ටෙන්ට් රෙදි | 40 | | 100 | 200 | 500 | | 400 | 50 | |
| පැදුරු | | 29 | 25 | 100 | 200 | 1084 | 25 | | 17 |
| මෙට්ට | | | 50 | | | | | | |
| කූඩාරම් | | | 75 | | 75 | | | | 1 |
| මදුරු දැල් | | | | 50 | 150 | | | | |
| තුවා | | 400 | | 300 | 500 | 1000 | | | |
| මූළුතැන්ගෙයි උපකරණ කට්ටල | 12 | 355 | 157 | 10 | 20 | 3 | 7 | | |
| බූට් සපත්තු | | 60 | 100 | | 25 | 60 | 10 | | |
| වැහි කබා | | | | | 12 | | | | |
| කුඩ (ලොකු) | | | 101 | | 8 | | | | |

| ද්‍රව්‍යය | මඩකලපුව | හම්බන්තොට | කුරුණෑගල | මොනරාගල | නුවර එළිය | ගාල්ල | යාපනය | මහනුවර | කිලිනොච්චි | මන්නාරම | මුලතිව් | වව්නියා | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජල බෝතල්(ලීටර් 5) | | | 1995 | | | | | | | | | | 4462 |
| ජල බෝතල්(ලීටර් 1.5) | | | | | | | | | | | | | 192 |
| ජල බෝතල්(ලීටර් 19) | | | | | | | | | | | | | 150 |
| ජල ටැංකි(ලීටර් 1000) | | 16 | | 14 | | | | | | | | | 138 |
| බ්ලැන්කට් | | | | | | | | | | | | | 3299 |
| ඇඳ ඇතිරිලි | | | | | | | | | | | | | 1737 |
| ඇඳ ඇතිරිලි(ඉන්දියන්) | | | | | | | | | | | | | 440 |
| ටාපෝලීන් ටෙන්ට් රෙදි | | | | | | | | | | | | | 1290 |
| පැදුරු | | | | | | | | | | | | | 1480 |
| මෙට්ට | | | | | | | | | | | | | 50 |
| කූඩාරම් | | | | | 79 | | | | | | | | 230 |
| මදුරු දැල් | | | | | | | | | | | | | 200 |
| තුවා | | | | | | | | | | | | | 2200 |
| මූළුතැන්ගෙයි උපකරණ කට්ටල | 12 | 40 | 5 | | | 5 | 9 | 5 | 9 | 9 | 5 | 9 | 672 |
| බූට් සපත්තු | | | | | | | | | | | | | 255 |
| වැහි කබා | | | | | | | | | | | | | 12 |
| කුඩ(ලොකු) | | | | | | | | | | | | | 109 |

**<u>පානීය ජල අවශ්‍යතාවය සපුරාලීම</u>**

| **දිස්ත්‍රික්කය** | **ප්‍රතිපාදන ප්‍රමාණය(රු.)** |
|---|---|
| අම්පාර | 3,000,000.00 |
| අනුරාධපුරය | 1,500,000.00 |
| බදුල්ල | 500,000.00 |
| මඩකලපුව | 500,000.00 |
| ගාල්ල | 150,000.00 |
| හම්බන්තොට | 5,095,000.00 |
| කළුතර | 1,000,000.00 |
| නුවර | 300,000.00 |
| කිළිනොච්චි | 500,000.00 |
| මන්නාරම | 1,300,000.00 |
| මාතලේ | 700,000.00 |
| මොණරාගල | 2,275,000.00 |
| මුලතිව් | 500,000.00 |
| පොළොන්නරුව | 2,000,000.00 |
| රත්නපුර | 500,000.00 |
| ත්‍රිකුණාමලය | 700,000.00 |
| වව්නියාව | 1,000,000.00 |
| **මුළු ගණන** | **21,520,000.00** |

**මූලාශ්‍රය: ජා.ආ.ස.සේ.ම.**



දිස්ත්‍රික්ක 16 ක ඇතිවූ වියළි කාලගුණික තත්ත්වය හේතුවෙන් සිවිල් ජනතාවට ඇතිවූ අපහසුතාවය කඩිනමින් මගහරවාගැනීම සඳහා ඔවුන්වෙත පාණීය ජලය ලබාදීම සිදුකරන ලදි. එහිදී පානීය ජලය සැපයීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත 119,695,836.35 ක ප්‍රතිපාදන නිදහස් කරන ලද අතර, ජලබෝතල් සැපයීම ද සිදුකරන ලදි. තවද, ජලය සැපයීමේ කටයුතු සඳහා යොදාගැනීමට ජල ටැංකි ලබාදීම සිදුකරන ලදි. මෙහිදි ජල ටැංකි 127 ක් මොණරාගල, පොළොන්නරුව හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික් ලේකම් කොට්ඨාස සඳහා ලබාදී ඇත.මීට අමතරව ජලටැංකි මිලදී ගැනීම සඳහා රුපියල් 21,520,000.00 ක ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කොට්ඨාස වෙත ලබාදී ඇත.







තාවකාලිකව ඇතිවන නියං හා ගංවතුර තත්ත්වයන්හි දී සිවිල් වැසියන්ගේ පානීය ජල අවශ්‍යතාවය සපුරාලීම සඳහාත් කඩිනම් ආපදා සහන ලබාදීමේ අරමුණින් හා ඉදිරියේදී ඇතිවන ආපදා තත්ත්වයන් සඳහා සාර්ථකව මුහුණදීම සඳහාත් ගතහැකි එක් පියවරක් ලෙස දිස්ත්‍රික් ලේකම් කොට්ඨාශ 18 ක් වෙත ට්‍රැක්ටර් බවුසර් 54 ක් හා ලොරි බවුසර 07ක් ලබාදීම සිදුකොට ඇත.

පසුගිය කාලසීමාව තුළ පැවති වියළි කලාපයේ වියළි කාලගුණික තත්ත්වය හේතුවෙන් ඇතිවූ පානීය ජල අවශ්‍යතාවය සපුරලීම සඳහා මෙම බවුසර් යොදා ගනිමින් පානීය ජලය අඛණ්ඩව ජනතාව වෙත ලබාදීම සිදු කරන ලදි. එමගින් වියළි කලාපීය ජනතාවට ඇතිවීමට තිබූ අයහපත් බලපෑම් අවම කරගැනීමට හැකිවිය. විශේෂයෙන් දෛනිකව ලැබිය යුතු ජල ප්‍රමාණය නොලැබීමෙන් ඇතිවිය හැකි රෝගාබාධ වලක්වාගැනීමට මින් හැකිවී ඇත.

**<u>සුළු පුනරුත්තාපන කටයුතු</u>**

ආපදාවන් හේතුවෙන් හානියට පත් මාර්ග, බෝක්කු, පැතිබැම්, කුඩා පාලම් ආදිය නිසා ජනතාවගේ දෛනික ජනජීවිතය ආඩාලවීම හා ඔවුන් ලක්වන අපහසුතාවයන් මගහරවා ගැනීම සඳහා සුළු පරිමාණ පුනරුත්තාපන කටයුතු සඳහා දිස්ත්‍රික්ක වෙත ප්‍රතිපාදන ලබාදී ඇත.

| දිස්ත්‍රික්කය | ලබාදුන් ප්‍රතිපාදන(රුපියල්) |
|---|---|
| අම්පාර | 4,900,000 |
| අනුරාධපුරය | 10,000,000 |
| බදුල්ල | 14,000,000 |
| ගම්පහ | 10,000,000 |
| හම්බන්තොට | 220,706,683 |
| කළුතර | 23,619,159 |
| මහනුවර | 50,000,000 |
| කෑගල්ල | 1,000,000 |
| කිලිනොච්චි | 10,000,000 |
| මන්නාරම | 5,000,000 |
| මාතලේ | 13,107,991 |
| මොණරාගල | 35,000,000 |
| පොලොන්නරුව | 15,443,000 |
| රත්නපුර | 9,125,200 |
| ත්‍රිකුණාමලය | 50,000,000 |
| | |
| වවුනියාව | 5,000,000 |
| මුළු එකතුව | 476,902,033.12 |



**<u>ආපදා හේතුවෙන් හානියට ලක්වූ නිවාස ප්‍රතිසංස්කරණය කිරීම</u>**

ආපදා හේතුවෙන් ජනතාවට ඇතිවූ විශාලතම බලපෑම පදිංචිව සිටි නිවාස විනාශයට පත්වීමයි. ආපදාව සිදුවී ජනජීවිත යථා තත්ත්වයට පත් වුවද තම ජීවන කටයුතු කරගෙන යාම උදෙසා වාසස්ථානයක් නොමැතිවීම තුළින් ඔවුනට ඇතිවන අපහසුතාවයන් වලක්වාගැනීම ඉතා වැදගත් වන්නේය. විශේෂයෙන් පූර්ණ නිවාස හානි සිදුවූ අවස්ථාවන්හි දී ඔවුන් තාවකාලික රැඳවුම් මධ්‍යස්ථාන වෙත යොමු කිරීමට සිදුවේ. එහිදී ඔවුනගේ අවශ්‍යතාවයන් සපුරාලීමට අධික පිරිවැයක් දැරීමට රජයට සිදුවේ. මේ හේතුවෙන් ආපදාවට ලක්වන නිවාස සඳහා කඩිනමින් සහනාධාර ලබාදීම සිදුකරනු ලැබේ.


2012, 2013, 2014 යන වර්ෂයන්හී දි ඇතිවූ ආපදා තත්ත්වය හේතුවෙන් විනාශයට පත් වූ නිවාස සඳහා ජනතාව වෙත ආධාර ලබාදීම වෙනුවෙන් රුපියල් මිලියන 1840.120 ක ප්‍රතිපාදන නිදහස් කල අතර, එම ප්‍රතිපාදන දිස්ත්‍රික්ක 25 සඳහා බෙදා දීම සිදුකරන ලදි. 2013 හා 2014 වර්ෂ සඳහා ඉතිරි ප්‍රතිපාදන ප්‍රමාණය ද මේ වන විට ලබාදී ඇත. ගංවතුර, අකුණු හා සුළිසුළං හේතුවෙන් සිදුවන පූර්ණ නිවාස හානි සඳහා රු 100,000/= ද මුදලක් ද අර්ධ නිවාස හානියක් සඳහා රු 50,000/= මුදලක් ද වශයෙන් ගෙවීම් සිදුකරනු ලැබේ.

**නිවාස ප්‍රතිසංස්කරණය සඳහා ගෙවීම්- 2014**

| දිස්ත්‍රික්කය | ලබාදුන් ප්‍රතිපාදන ප්‍රමාණය (රු.) | පූර්ණ හානි නිවාස සංඛ්‍යාව | අර්ධ හානි නිවාස සංඛ්‍යාව | වියදම රු. |
|---|---|---|---|---|
| අම්පාර | 10,230,350.00 | 14 | 463 | 8,121,630.00 |
| අනුරාධපුර | 24,294,693.52 | 75 | 372 | 15,757,370.00 |
| බදුල්ල | 46,726,900.00 | 55 | 3311 | 39,643,440.00 |
| මඩකලපුව | 468,350,000.00 | 2600 | 4167 | 468,350,000.00 |
| කොළඹ | 2,100,000.00 | 5 | 109 | 2,044,750.00 |
| ගාල්ල | 16,838,886.00 | 146 | 1128 | 16,710,987.73 |
| ගම්පහ | 13,677,405.00 | 47 | 506 | 13,526,422.00 |
| හම්බන්තොට | 43,600,084.76 | 535 | 1029 | 43,600,084.00 |
| යාපනය | 24,000,400.00 | 28 | 1394 | 24,000,400.00 |
| කළුතර | 59,968,400.00 | 250 | 2186 | 59,968,400.00 |
| මහනුවර | 18,774,158.50 | 30 | 902 | 17,537,846.00 |
| කෑගල්ල | 5,202,000.00 | 21 | 232 | 5,202,000.00 |
| කිලිනොච්චි | 3,878,000.00 | 1 | 76 | 3,878,000.00 |
| කුරුණෑගල | 19,175,550.99 | 157 | 236 | 18,055,417.00 |
| මන්නාරම | 100,239,000.00 | 0 | 0 | 99,375,000.00 |
| මාතලේ | 13,957,625.10 | 67 | 343 | 11,349,283.41 |
| මාතර | 30,628,809.50 | 280 | 402 | 30,472,731.00 |
| මොණරාගල | 8,919,854.50 | 58 | 291 | 8,726,208.62 |
| මුලතිවු | 1,795,000.00 | 9 | 37 | 1,795,000.00 |
| නුවරඑළිය | 11,300,668.00 | 0 | 0 | 10,425,877.00 |
| පොලොන්නරුව | 47,509,346.45 | 499 | 650 | 45,356,040.00 |

| | | | | |
|---|---|---|---|---|
| පුත්තලම | 381,560.00 | 0 | 24 | 381,560.00 |
| රත්නපුර | 28,814,096.00 | 135 | 1322 | 28,098,747.00 |
| ත්‍රිකුණාමලය | 5,426,300.00 | 0 | 0 | 5,426,300.00 |
| වවුනියාව | 351,736,000.00 | 1592 | 3863 | 348,807,422.17 |
| එකතුව | 1,357,525,088.32 | 6604 | 23043 | 1,326,610,915.93 |

**මූලාශ්‍රය : ජා.ආ.ස.සේ.ම.**




ආපදාවට ලක් වූ නිවාස





නව නිවාස





**<u>ආපදා ප්‍රත්‍යස්ත නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය</u>**

ආපදාවට ලක්වූවන්ගේ නිවාස ප්‍රතිසංස්කරණ සහ ඉදිකිරීම් කටයුතු සඳහා රජය වාර්ෂිකව විශාල ආයෝජනයක් සිදුකරනු ලැබේ. රටේ තිරසාර සංවර්ධනයට මෙය සෘජු බලපෑමක් ඇති කරයි. මේ සඳහා ජාතික ආපදා සහනසේවා මධ්‍යස්ථානය විසින් ඊට විසඳුමක් ලෙස ආපදාවන්ට ඔරොත්තුදීමේ නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදි. ඕමාන් රජයේ මූල්‍ය ආධාර ඇතිව 2014 වර්ෂයේ දී මාතර දිස්ත්‍රික්කයේ නිවාස ඉදිකිරීම ආරම්භ කරන ලදි. එක් දිස්ත්‍රික්කයකට නිවාස 06 බැගින් නිවාස ඉදිකිරීම මේ වනවිට සිදුකරමින් පවතී. දැනට දිස්ත්‍රික් 10 ක නිවාස ඉදිකිරීම අවසන් කර ඇත.

2014-12-31 දිනට ආපදාවට ඔරොත්තු දීමේ නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ප්‍රගතිය

| දිස්ත්‍රික්කය | නිවාස ගණන | ප්‍රතිපාදන නිදහස් කිරීම් | ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | භෞතික | මූල්‍ය |
| අම්පාර | 6 | 3,000,000.00 | වැඩ නිම කර ඇත | 3,000,000.00 |
| අනුරාධපුරය | 6 | 2,313,303.90 | බිත්ති බැඳීම් කටයුතු සිදු කෙරේ | 1,644,625.00 |
| බදුල්ල | 6 | 1,500,000.00 | අත්තිවාරම කැපීම | 712,800.00 |
| මඩකලපුව | 6 | 1,500,000.00 | බිත්ති නිම කර ඇත | 1,500,000.00 |
| කොළඹ | 6 | 3,000,000.00 | නිවාස 3 ක අවසන්ය. සෙසු නිවෙස්වල වහලය අවසන් කර ඇත. | 2,357,500.00 |
| ගාල්ල | 6 | 3,000,000.00 | වැඩ අවසන් කර ඇත | 3,000,000.00 |
| ගම්පහ | 7 | 3,500,000.00 | වැඩ නිම කර ඇත | 3,000,000.00 |
| හම්බන්තොට | 6 | 3,000,000.00 | වැඩ නිම කර ඇත | 3,000,000.00 |
| යාපනය | 6 | 3,000,000.00 | වැඩ නිම කර ඇත | 3,000,000.00 |
| කළුතර | 6 | 3,000,000.00 | වැඩ නිම කර ඇත | 3,000,000.00 |
| මහනුවර | 6 | 3,000,000.00 | ගෙවල් 4 ක් නිම කර ඇත. 2 ක් අවසන් අදියර | 2,980,000.00 |
| කෑගල්ල | 6 | 3,000,000.00 | බිත්ති බැඳීම් වහල මට්ටම දක්වා | 2,075,000.00 |
| කිලිනොච්චිය | 6 | 1,500,000.00 | බිත්ති බැඳීම් කටයුතු සිදු කෙරේ | 1,500,000.00 |
| කුරුණෑගල | 6 | 3,000,000.00 | වහලය නිම කර කපරාරු කරමින් ඇත | 2,253,256.00 |
| මුලතිව් | 6 | 3,000,000.00 | කපරාරු අවසන් කර ඇත | 3,000,000.00 |
| මන්නාරම | 6 | 1,500,000.00 | වැඩ ආරම්භ කර ඇත | 2,200,000.00 |
| මාතලේ | 6 | 3,000,000.00 | වැඩ නිම කර ඇත | 3,000,000.00 |
| මාතර | 6 | 3,000,000.00 | වැඩ නිම කර ඇත | 3,000,000.00 |
| මොණරාගල | 6 | 1,500,000.00 | ලින්ටන් මට්ටම දක්වා නිම කර ඇත | 1,275,503.00 |
| නුවරඑළිය | 6 | 2,313,303.90 | නිවාස 2 ක බිත්ති නිම කර ඇත. සෙසු නිවාස සඳහා ද්‍රව්‍ය ඇණවුම් කර ඇත | 597,000.00 |
| පොළොන්නරුව | 6 | 1,500,000.00 | බිත්ති බැඳීම්අවසන් මට්ටමේ පවතී | 1,483,140.00 |
| පුත්තලම | 6 | 2,500,000.00 | බිත්ති බැඳ අවසන් කර ඇත | 2,750,000.00 |
| රත්නපුරය | 6 | 3,000,000.00 | නිවෙස් 05 ක් නිම කර ඇත | 2,500,000.00 |
| වවුනියාව | 6 | 1,500,000.00 | වැඩ නිම කර ඇත | 3,000,000.00 |
| **එකතුව** | **145** | **60,126,607.80** | | **55,828,824.00** |

ආපදාවට ඔරොත්තුදීමේ නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතියෙහි එක් අවස්ථාවක් පහත පරිදි වේ.






## පසු ආපදා කළමනාකරණ ක්‍රියාවලීන් පිළිබඳව ආපදා සහන සේවා නිලධාරීන් ගේ හැකියා වර්ධනය

පසු ආපදා අවස්ථාවන්හිදී පීඩාවට පත් ජනතාවගේ ජීවිත හා දේපල හානි අවමකරගැනීම සඳහා මනා පුහුණුවකින් යුතු ආපදා සහනසේවා නිලධාරීන්ගේ අවශ්‍යතාවය පසුගිය කාලයේ සිදුවූ සෑම ආපදා අවස්ථාවකදීම දැඩිලෙස ඉස්මතු වූ කාරණයක් විය. ඒ අනුව ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් බඳවාගනු ලැබූ සියලු ආපදා සහන සේවා නිලධාරීන්හට පසු ආපදා ක්‍රියාකාරකම් පිළිබඳ නිවැරදි හා විධිමත් අයුරින් ක්‍රියා කරනු ලබන ආකාරය පිළිබඳ ප්‍රායෝගික පුහුණු කිරීම් වැඩපිළිවෙලක් ආරම්භ කරන ලදි.

මේ වන විට ඔහිය තොටුපල කඳවුරු භූමියේදී කළුතර, ගම්පහ, බදුල්ල, මොණරාගල, කෑගල්ල, පුත්තලම, නුවරඑළිය යන දිස්ත්‍රික්කයන්හි ආපදා සහනසේවා නිලධාරීන් හට කඳවුරු කළමනාකරණය යටතේ කඳුවුරු භූමියකදී ඇතිවිය හැකි හදිසි අවස්ථාවන් සඳහා මුහුණදීම, මහජන සෞඛ්‍ය ආරක්ෂා කිරීම, රෝගීන් ආරක්ෂා කිරීම, ආපදාවට ලක්වූවන්ගේ මානසික සෞඛ්‍ය පවත්වාගෙන යාම, මිනිසුන් අතර ඇතිවිය හැකි ගැටුම් අවම කිරීම, කූඩාරම් ඉදිකිරීම, හදිසි ගිණිගැනීම් වලදී ආරක්ෂාවීම සහ මහජනයා ආරක්ෂා කිරීම, යටිතල පහසුකම් සම්පාදනය, විධිමත් ආකාරයේ සහනසේවා සැපයීම, නිවැරදි තොරතුරු වාර්තාකරනය හා මාධ්‍ය සබඳතාවය පවත්වාගෙන යාම, සීමිත සම්පත් උපරිම ඵලදායීතාවයෙන් ප්‍රයෝජනයට ගැනීම ඇතුළු කඳවුරක් තුළදී හැසිරිය යුතු ආකාරය හා එය පවත්වාගෙන යාම හා විශේෂයෙන් ආහාර සැපයීමේදී සැලකිලිමත් වියයුතු කරුණු පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව ලබාදෙන ලදි.





පුහුණු කඳවුරු භූමිය වෙත නිලධාරීන් ලඟාවන ආකාරය.

කඳවුරු භූමිය ඉදිකිරීම



ප්‍රථමාධාර පිළිබඳ පුහුණුවීම්



කූඩාරම් ඉදිකිරීම



ගිණි නිවීම පිළිබඳ පුහුණුවීම්



## තොරතුරු සන්නිවේදන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම

තොරතුරු සන්නිවේදන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම හා ආපදා පිළිබඳ තොරතුරු පවත්වාගෙන යාම වාර්තා කිරීම හා තම කටයුතු කාර්යක්ෂමව හා වඩාත් ඵලදායී ලෙස සිදුකරගෙන යාමට ජාතික ආපදා සහනසේවා මධ්‍යස්ථානය විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි කාර්යයේ නියුතු ආපදා සහනසේවා නිලධාරීන් වෙත ලැප්ටොප් පරිගණක යන්ත්‍ර හා ඩොංගල් ලාබදීම සිදුකරන ලදි. එහිදී. අනුරාධපුර, මහනුවර, මාතලේ, ත්‍රිකුණාමලය, මඩකළපුව, වව්නියාව, මන්නාරම, යාපනය, මොණරාගල, කෑගල්ල,

ගාල්ල, පුත්තලම, කුරුණෑගල, පොළොන්නරුව, මාතර යන දිස්ත්‍රික් ආපදා සහන නිලධාරීන් වෙත මේ වන විට එම පහසුකම් සපයා ඇත.





**පසු ආපදා තත්තවයන්ට මුහුණදීම සඳහා පාසල් ළමුන් හා ප්‍රජාව  දැනුවත් කිරීම**

මේ වන විට සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි සේවය කරන ආපදා සහන සේවා නිලධාරීන් මඟින් ආපදාවන්ට ලක්වන සෑම ග්‍රාම නිලධාරී කොට්ඨාශයක ම ආපදා කමිටු පිහිටුවීම  සිදුකොට ඇත. එම කමිටුවල සහාය ඇතිව මේ වන විට හදිසි ආපදා තත්ත්වයන්හි දී ක්‍රියාත්මක වීම සිදුවේ. ඒ අනුව  ඔවුන් අවශ්‍ය දැනුවත් කිරීම් හා එම කමිටු සක්‍රීයව පවත්වාගෙන යාම සිදුකරකරගෙන යනු ලැබේ . ඊට අමතරව පාසල් මට්ටමින් ආපදා අවස්ථාවන්හි දී ක්‍රියාත්මක වියයුතු ආකාරය හා ඔවුනට ඒ සම්බන්ධයෙන් දායකවියහැකි ආකාරය  මෙන්ම තමන් විසින්ම තම ආරක්ෂාව සපයාගත යුතු ආකාරය හා අන් පිරිසට උපකාර කල හැකි ආකාරය  පිළිබඳව දැනුවත් කිරීම ආපදා සහන සේවා නිලධාරීන් විසින් සිදුකරනු ලැබේ.





**ඉදිරි සැලසුම් (2015)**

- ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය සඳහා 2015 වර්ෂය වෙනුවෙන් වෙන්කරන ලද ප්‍රතිපාදන යොදා ගනිමින් ස්වභාවික ආපදාවන්ගෙන් විපතට පත්වන ජනතාවට ජාතික අයවැය චක්‍රලේඛ අංක 152 (I) ට අනුව කඩිනම් සහන සැලසීම, මාස තුනක් තුළ දී හානියට පත්වන නිවාස ප්‍රතිසංස්කරණය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබාදීම හා බිඳ වැටුන ජීවනෝපාය මාර්ග නගා සිටුවීම සඳහා සහනාධාර ලබාදීම.

- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි සහන සේවා කටයුතු සිදුකිරීම සඳහා බඳවා ගන්නා ලද නවක උපාධිධාරීන් සඳහා ආපදා කළමනාකරණ ක්‍රියාවලීන් පිළිබඳව මෙන්ම සහන සේවා කටයුතු කාර්යක්ෂමව හා විධිමත්ව ඉටු කිරීම පිළිබඳව දැනුවත් කිරීමේ පුහුණු වැඩමුළු දිස්ත්‍රික්ක මට්ටමින් පැවැත්වීම.

- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා අනුයුක්ත කර ඇති ආපදා සහන සේවා නිලධාරීන් මඟින් ග්‍රාමීය ආපදා සහන සේවා කමිටු පිහිටුවීම හා පසු ආපදා තත්තවයන් සඳහා සාර්ථකව මුහුණදීම පිළිබඳව ග්‍රාමීය ප්‍රජාව හා පාසල් ළමුන් දැනුවත් කිරීම හා ඒ පිළිබඳව විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- පසු ආපදා තත්ත්වයකදී සහන සේවා කටයුතු වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නිවැරදි දත්ත හා තොරතුරු ආපදාව සිදු වී කෙටි කාලයක් තුල වාර්තා කිරීම සඳහා ස්ථාපිත සහන මෘදුකාංගය දිවයින පුරා ක්‍රියාත්මක කිරීම හා ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් දිස්ත්‍රික්ක මට්ටමින් ස්ථාපිත කිරීම.

- ආපදාවන්ගෙන් පූර්ණ හානියට ලක්වන නිවාස සඳහා ලබාදෙනු ලබන ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් නැවත ඉදිකරනු ලබන නිවස ආපදාවන්ට ඔරොත්තු දියහැකි නිවසක් ලෙස ඉදිකිරීමට කටයුතු කිරීම. මේ සඳහා දේශීය මෙන්ම විදේශීය අධාර යොදාගැනීම.

- දැනට හඳුනාගෙන ඇති ආපදා බහුලව සිදුවන අවධානම් කළාප සිතියම්ගත කිරීම හා එම ප්‍රදේශයන්හි ජීවත් වන ජනතාව හඳුනා ගැනීම, දැනුවත් කිරීම හා සුරක්ෂිත ස්ථාන කරා යොමුකිරීමට අවශ්‍ය උපරිම සහයෝගය හා දායකත්වය ලබාදීම.

- සහන මෘදුකාංගය භාවිතයට ගනිමින් සපයනු ලබන ආපදා පිළිබඳ නිවැරදි තොරතුරු හා වාර්තා ආපදා පිළිබඳ සොයාබලනු ලබන ඕනෑම පාර්ශවයක් වෙත ක්ෂණිකව අන්තර්ජාලය හරහා ලබාගැනීමට අවකාශය ලබාදීම.

- ප්‍රශස්ථ පසු ආපදා සහන සේවාවන් තුළින් තිරසාර සංවර්ධන ජාතික ඉලක්කය වෙත සක්‍රියව දායක වීම.